<u>**2019/07/09 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව**</u>

2019/07/09 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |

**සහභාගී නොවූ**

| | | |
|---|---|---|
| 01. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2019.07.09 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. උප සභාපතිතුමා ඇතුළු පැමිණ සිටින සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඉතා ගෞරවයෙන් පිළිගනිමින්, 2019 ජූලි මාසයට අදාල සැසි වාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. පෙර සභාවල පරිදිම ඔබ සියළු දෙනාගේ සහයෝගය මම ඉතා ගෞරවයෙන් අපේක්ෂා කරනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත

**(අ)02. 2019.06.11 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

2019.06.11 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස **ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

01. ගරු මන්ත්‍රී පී.ජී. රංජිත් ජයවීර මහතා අසනීපව සිටින බැවින් 2019.07.09 වන දින මාසික සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බවත්, එබැවින් නිවාඩු අනුමත කර දෙන ලෙසත් දන්වා ලිපියක් එවා ඇති අතර, ඔහුට නිවාඩු අනුමත කිරීමට කටයුතු කරන ලෙස දන්වමි.

02. ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ගාල්ල දිසා අධිකරණයේ පවතින අංක එල් 15888 දරණ නඩුවට සහභාගී වීමට නියමිතව ඇති බැවින්, 2019.07.09 දින පැවැත්වෙන මාසික මහා සභා රැස්වීමට ප්‍රමාද වී පැමිණෙන බව දන්වා ලිපියක් යොමු කර ඇති බව දන්වමි.

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. පළාත් පාලනයට අදාළ සුවිශේෂී ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳව පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතවරුන් දැනුවත් කිරීම් වැඩසටහන - 2019 , සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින යොමු කර ඇති 2019.06.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

02. පාර සාදා ගැනීම සඳහා මාර්ගය පවරා ගැනීමට කටයුතු කර ගැනීම පිනිස විමල් ජයසේකර අංක 10 අත්කම් නිවාස යෝජනා ක්‍රමය, වලකුඹුර, නාගොඩ විසින් යොමු කරන ලද 2019.07.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.

03. නාවින්න 37 කන්ද මාර්ගයට පිවිසෙන මාර්ගයේ ආරම්භක ස්ථානයේ පවතින ඇළට, පාලමක් ඉදිකිරීම සම්බන්ධව, නාවින්න, මාපලගම (මධ්‍යම) ගම්වාසීන් විසින් යොමු කරන ලද 2019.07.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

04. උහන්ඕවිටවත්ත අතුරු මාර්ගයට බෝක්කු 02 ක් ලබා ගැනීම සම්බන්ධව, උහන්ඕවිටගෙදරවත්ත, මානගොඩ, 215- අලුත් පහළ, මාපලගම (මධ්‍යම) ගම්වාසීන් විසින් යොමු කරන ලද 2019.07.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.

05. කැඩී ගොස් ඇති පාර සඳහා සිළිංඩර දෙකක් ලබාගැනීම සම්බන්ධව අමුහේන්කන්ද, පරණතානායම්ගොඩ, මාපලගම ගම්වාසීන් විසින් යොමු කරන ලද 2019.07.04 දිනැති ලිපිය සභාගත කරන ලදී.

06. බතලවත්ත සිට පොල්හේන හරහා ඌරල දක්වා දිවෙන පාරේ බෝක්කුව සාදා ගැනීම සම්බන්ධව පොල්හේන, මීදැල්ල, ඌරල, වදුරඹ පදිංචි එම්.ඒ.ඩැනියෙල් මහතා විසින් යොමු කරන ලද 2019.07.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

07. 2017 වර්ෂයට අදාළව හිඟ පොළ බදු සහ පොලී ගෙවීම සම්බන්ධව තල්ගස්වල නව නගරය, "ප්‍රසාද්", හි කේ.බී.අමල් ප්‍රසාද් මහතා විසින් යොමු කරන ලද 2019.07.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

08. තල්ගස්වල බදාදා සති පොළෙහි කුණු කසළ ඉවත් කිරීම සම්බන්ධව, තල්ගස්වල ඇඟළුම් කම්හල අසල, කේ.බී. වසන්ත කුමාර විසින් යොමු කරන ලද 2019.07.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව පැහැදිලි කරමින් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ, පොළ බදු කරුට පොළ පිරිසිදු කිරීම සඳහා සේවකයන් සපයා ගැනීමට නොහැකි බැවින්, සභාවේ සේවකයන් දෙදෙනකු යොදවා අදාළ පිරිසිදුකිරීම් සිදු කර දෙන ලෙස ඉල්ලා ඇති බවයි. ඒ වෙනුවෙන් සතියකට රු. 3000.00 ක මුදලක් සභාවට ගෙවීමට ඔහු එකඟතාවය පළ කර ඇති බවයි.

එහිදී ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා ප්‍රකාශ කර සිටියේ, සතියකට රු. 3000.00 ක මුදලක් ගෙවනවා නම්, මේ කටයුතුත සිදු කල හැකි බවයි. එහෙත් ගරු උප සභාපතිතුමා හා ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා කියා සිටියේ එම මුදල් අය කර ගැනීමට ක්‍රමවේදයක් නොමැති බවත්, එම මුදල් ලබා ගත යුත්තේ ලදුපතක් නිකුත් කිරීමෙන් අනතුරුව බවයි. ආයතනයකින් කසළ ලබා ගැනීම වෙනුවෙන් මුදල් අය කරනවා සේ පුද්ගලයකුගෙන් කසල ගැනීම වෙනුවෙන් මුදල් ලබා ගැනීම සිදු කල නොහැකි බව පෙන්වා දෙන අතර, එසේ වුවහොත් ඒ සඳහා විගණන විමසුම්වලට ලක්විය හැකි බවද වැඩිදුරටත් පෙන්වා දෙන ලදී.

මෙහිදී ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා කියා සිටියේ මේ සඳහා ගිවිසුමක් සකස් කර, ඒ අනුව කටයුතු කිරීම මගින් ගැටළුවක් ඇති නොවන බවයි.

අවසාන වශයෙන් ගරු සභාපතිතුමා කියා සිටියේ, මේ කටයුතු කිරීමේදී සියල්ල ලිඛිතව මිස කට වචනයට සිදු නොකරන බවයි.

09. පස් ඉවත් කර ගැනීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා එච්.ජී. නිමල් මයා, පොපියුලර් සැලුන්, නව නගරය, තල්ගස්වල විසින් යොමු කරන ලද 2019.07.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පොළට මායිම්ව පිහිටා ඇති පොපියුලර් සැලුන් ආයතනයේ පිටුපස කොටසේ පස් ඉවත්කර ගැනීම සඳහා මේ අය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීමක් කර ඇති බවත්, ප්‍රාදේශීය ලේකම් විසින් ග්‍රාම නිලධාරී මාර්ගයෙන් සභා ඉඩමේ මායිම් පෙන්වා දෙන ලෙස අප සභාව වෙත දැනුම් දී ඇත. ඒ අනුව තාක්ෂණ නිලධාරී සමඟ ගොස් අදාළ කටයුතු සිදු කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

10. තමාට සිදුව ඇති අසාධාරණයක් සම්බන්ධව, වින්දායා කේෂානි විජේවර්ධන, 150/1, උඩවැලිවිට්තලාව විසින් යොමු කරන ලද 2019.07.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

වින්දායා කේෂානි විජේවර්ධන මහත්මියගේ ලිපියේ සඳහන් අදාළ පුද්ගලයා මීට පෙර අවස්ථාවක කුණු දැමීමක් සම්බන්ධව වාර්තා වූ අතර ඒ සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ අවධානයට යොමු කල අතර, මෙම ලිපිය සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

11. මාර්ග සංවර්ධනය කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දීම සම්බන්ධව, ගරු දකුණු පළාත් සභා මන්ත්‍රී සුමනසිරි ලියනගේ මැතිතුමා විසින් යොමු කරන ලද 2019.06.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

12. 2019.07.15 දින ප්‍රථම වරට සංවිධානය කරනු ලබන පර්පල් රේන්ජ් රිද්ම රාත්‍රිය වෙනුවෙන් සභාවට අයත් වතුර බවුසරය සිංහ මිතුරු පදනම වෙත ලබා දී සමාදර අනුග්‍රහය දක්වන ලෙස ඉල්ලා සිංහ මිතුරු පදනම, මාමණ්ඩොළ, නාකියාදෙනිය විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ මෙම සංගීත ප්‍රසංගය මුදල් අය කර පෙන්වන එකක් නම්, නොමිලේ වතුර බවුසරය ලබා දිය නොහැකි බවත්, මුදල් අය නොකර පෙන්වන්නේ නම් පමණක් නොමිලේ වතුර බවුසරය ලබා දිය හැකි බවත්ය. එහිදී ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා කියා සිටියේ මෙම ප්‍රසංගය සඳහා මුදල් අය නොකරන බවයි.

13. අපවත් වී වදාල අතිපූජ්‍ය පොරවගම පේමානන්ද හිමියන්ගේ තෙමස් පූර්ණ පිංකම වෙනුවෙන් ජල බවුසරය ලබා දෙන ඉල්ලා ශ්‍රී ක්ෂේත්‍රාරාම පුරාණ විහාරයේ දායක සභාව විසින් යොමු කරන ලද 2019.07.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ, වතුර බවුසරය ඉල්ලා ඇති මෙම මස 12, 13 යන දිනයන් සඳහා වෙනත් අයකු විසින් මුදල් ගෙවා වතුර බවුසරය වෙන් කර ගෙන ඇති බවත්, එහෙත් වෙනත් විකල්පය ක්‍රමයක් අනුගමනය කර වතුර ලබාදීමට උත්සාහ ගන්නා බවත්, පසුගියදා මෙම හිමියන්ගේ ආදාහන පූජෝත්සවය අවස්ථාවේ වතුර බවුසරය පන්සල් භූමියට යාමට නොහැකි බැවින්, ටැංකි තබා වතුර සැපයූ අතර, මෙවරත් එසේම තෙමස් පූර්ණ පිංකම සඳහා නොමිලේ වතුර ලබාදීමට කටයුතු කරන බවයි.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

i. උඩුගම ඇප්තොප්වත්ත කොම්පෝස්ට් අංගනයේ කසල හලන යන්ත්‍රය සඳහා දැලක් ලබා ගැනීම

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

ii. ඇප්තොප්වත්ත කසල අංගනයේ කටයුතු සඳහා එස්ලෝන් අගල් 1/2 යේ වතුර හෝස් එකක් ලබා ගැනීම

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී බී.ජී. අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

**11.(8) සභා රීති යටතේ කරනු ලබන යෝජනා**

**11.(8) සභා රීති යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. අපවත් වී වදාල අතිපූජ්‍ය පොරවගම පේමානන්ද හිමියන්ගේ තෙමස් පූර්ණ පිංකම වෙනුවෙන් ජල බවුසරය නොමිලේ ලබා දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රි ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

ii. 2017 වර්ෂයට අදාළව හිඟ පොළ බදු සහ පොලී ගෙවීම සම්බන්ධව තල්ගස්වල නව නගරය, "ප්‍රසාද්", හි කේ.බී.අමල් ප්‍රසාද් මහතා විසින් ඉල්ලා ඇති පරිදි ඉදිරි මාස 12 ක කාලය තුල සම්පූර්ණ හිඟ මුදල සහ අදාල පොලීය ගෙවීමට අවස්ථාව ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මේ සම්බන්ධව ගරු උපසභාපතිතුමා, ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා, ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා, ගරු මන්ත්‍රී එන්.ඩබ්. පතිනායක මහතා අදහස් ප්‍රකාශ කරන ලද අතර ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා කියා සිටියේ පොළ බදුකරුගෙන් ලිඛිත පොරොන්දුවක් ගෙන මුදල් ගෙවීමට අවස්ථාව ලබා දෙන ලෙසයි. ගරු උප සභාපතිතුමා කියා සිටියේ පොරොන්දුව ලිඛිත වුවත්, වාචික වුවත් වලංගු නොවන බවයි.
ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා කියා සිටියේ මගේ පෞද්ගලික අදහස නම්, අපට අවශ්‍ය මුදල් අය කර ගැනීම බැවින් එකවර ගෙවීමට බල කිරීම නුසුදුසු බවත්, මෙම මුදල වාරික 10 කින් 12 කින් ලබා ගැනීමට හැකි නම් එය ඉතා වටිනා බවයි. උසාවි ගොස් මුදල් හා කාලය වැය කර මේ මුදල අය කර ගැනීමට වඩා කොටස් වශයෙන් අය කර ගැනීම සුදුසු බවයි.
ගරු මන්ත්‍රී අජිත් මහතා ප්‍රකාශ කර සිටියේ උසාවි ගියොත්, උසාවිය විසින් මෙම මුදල එකවර ගෙවීමට අනිවාර්යයයෙන් නියෝග කරන බැවිනුත්, මේ පුද්ගලයා අවුරුදු ගණනාවක් පොළේ බදුකරු ලෙස කටයුතු කල බැවිනුත්, ගරු සභාපතිතුමා ඔහු ගැන සෑහීමකට පත් වන්නේ නම් හා සභාව සෑහීමකට පත් වන්නේ නම්, ඔහුගේ ඉල්ලීම අනුව කටයුතු කිරීම සුදුසු බවයි.
ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා සහ ගරු මන්ත්‍රි අජිත් එඩේරආරච්චි මහතා වැඩි දුරටත් කියා සිටියේ ලිපියක් සකස් කර මේ මුදල වාරික 12 කින් ගෙවන බවට ඔහුගෙන් අත්සන ලබා ගෙන අවස්ථාව ලබා දෙන ලෙසත්, එසේම එම ලිපියේ වැඩිදුරටත් මෙම මුදල් නොකඩවා ගෙවන ලෙසත්, එසේ නොගෙවන්නේ නම්, දැණුම් දීමකින් තොරව, නඩු පවරන බවද, සඳහන් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රි විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

iii. නාගොඩ ප්‍රාදේශීය සභාව යටතේ පාලනය වන උඩුගම නැගෙනහිර රන් කැකුළු පෙර පාසල් ගොඩනැගිල්ලට විදුලිය ලබා දීමේ ඇස්තමේන්තු මුදල වන රු. 19765.16 ක මුදල සභා අරමුදලින් වියදම් දැරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එන්.වී. සමන් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

**18. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**2019.07.09 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**01.ඉදිරි ගෙවීම් (පොදු අරමුදල්)**

| | | |
|---|---|---|
| 8616373802 | - උඩුගම පොල | - රු. 240.00 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 240.00 |

**02. සී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**

උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම (2019.05.16- 2019.06.15) - රු. 688.50

**2019 මැයි සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම - 0912231201**

2019.05.01 – 2019.05.31 දක්වා - රු. 3926.34

**03. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. තාක්ෂණ නිලධාරී කමිටුවට සහභාගී වූ නිලධාරීන්ට දීමනා ගෙවීම වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 2500.00

ii. රාජකාරි අවශ්‍යතා සඳහා PF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 2650.00

**04.අතිකාල දීමනා ගෙවීම**

**2019 ජනවාරි මස**

| | | |
|---|---|---|
| පී.ජී. චන්ද්‍රදාස මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු.1943.02 |

**2019 ජුනි මස**

| | | |
|---|---|---|
| යූ.ජී. රංජිත් උදය කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු.1698.12 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 336.70 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 8031.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු.6981.16 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු.7680.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු.8360.00 |
| එන්.එම්.රජිත මයා | -අනියම් මුරකරු | - රු.6060.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර | - අනියම් රියදුරු | - රු.7315.00 |
| කේ.ජී. ලෙස්ලි සිරිවර්ධන මයා | - විදුලි කාර්මික | - රු.1918.21 |
| පී.කේ. චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු.2106.00 |

**05.2019 ජුනි මස පරිවර්ජිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 5250.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**06. 2019 ජුනි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන | - ගරු සභාපති | - රු. 7000.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 454.00 |
| අයි. චතුරි චින්තිකා | - සංවර්ධන නිලධාරී | - රු. 456.00 |
| ජී.පී.ජී. ශ්‍රීණිකා මිය | - කළමනාකරණ සහකාර | - රු. 456.00 |
| යූ.වී. මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1050.00 |
| කේ.කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1170.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 5600.00 |
| චන්දිමා සෙනවිරත්න මිය | - කළමනාකරණ සහකාර | - රු. 456.00 |

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| ඉරේෂා මල්කාන්ති මදනායක | - සංවර්ධන නිලධාරී | - රු. 1820.00 |

**07. යූ.කේ.ජයන්ත මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2019/06/28) - රු. 500.00

II. ආහාර සාම්පල් පරීක්ෂාවට කළුතර ජාතික සෞඛ්‍යායතනයට යාම වෙනුවෙන් ගෙවීම (2019.05.30) - රු. 800.00

**08. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

i. විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු ගෙවීම - රු. 10000.00

**09.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**

**2019 මැයි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

| | |
|---|---|
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 58 ක් | - රු. 6032.00 |
| LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 50 ක් | - රු. 5200.00 |
| **එකතුව** | **- රු. 11232.00** |

**10. කේ.ජී. ධනසිරි මයා තෙල් පිරවුම්හල, ගා/නාගොඩ**

**2019 ජුනි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 600ක් | - රු. 62400.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 160 ක් | - රු. 16640.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 120 ක් | - රු. 12480.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 145 ක් | - රු. 15080.00 |
| ජලභීතිකා රෝග මර්ධනය සඳහා ගමන් කරන ලද රථයට ගෙවීම් ඩීසල් ලීටර් 160 | - රු. 16640.00 |
| **එකතුව** | **- රු.123240.00** |

**11.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 ජූලි මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු.28500.00
ii. 2019 අප්‍රේල් මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 2520.00

**12.එච්.එල්.කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 ජුනි - රු.5270.00

**13.බුද්ධික කරුණාරත්න මයා, රත්නගිරි ස්ටෝර්ස්, මාපලගම**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 මාර්තු - රු. 4800.00
2019 අප්‍රේල් - රු. 4330.00

**14.එම්.ඒ සිරිපාල මයා, සේසිරි ස්ටෝර්ස්, මාපලගම**

මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 මාර්තු - රු. 2890.00
2019 අප්‍රේල් - රු. 2590.00
2019 මැයි - රු. 2780.00

**15.ඒ.ඩී. කරුණාරත්න,සරත් ස්ටෝර්ස්, යටලමත්ත**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 මැයි - රු. 7240.00
2019 ජුනි - රු. 7380.00

**16. සී/ස එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම, ලේක්හවුස්, කොළඹ 10**

මහජන පුස්තකාල 03 සඳහා ලබා ගන්නා ලද සත් මඩල මාසික සඟරාව වෙනුවෙන් මුදල් ගෙවීම (අප්‍රේල්, මැයි, ජුනි මාස සඳහා) - රු. 540.00

**17. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

i. PF 7360 දරණ කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.13680.00

**18. නිව් විජය මෝටර්ස්, ගාල්ල**

PF 7360 දරණ කැබ් රථය සඳහා බැටරියක් මිළදී ගැනීමේ බිල්පත - රු.18700.00

**19. ටී.ජී. සුමනසිරි මයා, නාගොඩ**

ප්‍රධාන කාර්යාලය සඳහා ගෑස් සිළිංඩරයක් ලබා ගැනීමේ බිල්පත - රු. 715.00

**20. චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල**

උඩගම පොළ සංවර්ධනය සඳහා පී.වී.සී. බට ලබා ගැනීමේ බිල්පත් - රු. 102900.00

**21. සෙල් එක්ස් කම්පියුටර්ස්, ගාල්ල**

මාපලගම උප කාර්යාලය හා උඩුගම උප කාර්යාලයට ඇඟිලි සළකුණු යන්ත්‍ර 2 ක් මිළදී ගැනීම වෙනුවෙන් ගෙවීම - රු. 58600.00

**22.** **ලයන් ෆොටෝ, ගාල්ල**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් චන්ද්‍රිකා දයාවංශ මහත්මියගේ රාජකාරි හැඳුනුම්පත සකස් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 410.00

**23.** **සවුත් නෙට් ටෙක්නොලොජීස් ප්‍රයිවට් ලිමිටඩ්, ගාල්ල**
HP 1005 ප්‍රින්ටරය අළුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම - රු. 900.00

**24.** **දමිත් බෝදරගම, උඩුගම**
2019.06.25 සහ 26 දෙදින පැවැත්වූ ජංගම වැඩසටහන පිළිබඳ ව්‍යාපාරිකයන් දැනුවත් කිරීම සඳහා ලබා ගත් ශබ්ද විකාශන යන්ත්‍රයට ගෙවීම් - රු. 1500.00

**25.** **එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා ජූලි මස මාසික කුළිය ගෙවීම - රු. 4000.00

**26.** **සිංහගිරි ග්‍රොසරි, උඩුගම**
සෞඛ්‍ය කම්කරුවන් සඳහා අප්‍රේ , මැයි, ජුනි මාස සඳහා ලබා ගත් සබන් වෙනුවෙන් ගෙවීම් බිල්පත - රු. 3600.00

**27.** **ඊ.ඒ. එස්. කේ. එදිරිසිංහ මයා, එදිරිසිංහ මෝටර්ස්, උඩුගම**

i. LL 7650 කෘ කැබ් රථයේ රථයේ ඔයිල් සීල් ගසා පිටුපස රෝද දෙක ග්‍රීස් යොදා සවි කිරීමේ බිල්පත - රු. 4460.00

**28.** **නානායක්කාර හාඩ් වෙයාර්, නාගොඩ**
මාපලගම උප කාර්යාලය සඳහා මල්ටිප්ලග් එකක් ලබා ගැනීම - රු. 750.00

**29.** **යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2019 ජුනි) - රු.13000.00

**30.** **දසමස් වැටුප් අත්තිකාරම් ගෙවීම්**
බි.එම්.ජී. තරංගා දිල්රුක්ෂි මිය - රු.230900.00

**31.** **ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10**
දුම්රිය බලපත්‍ර බිල්පත් සඳහා මුදල් ගෙවීම
එම්. ඒ. මහින්දදාස මයා ( ගාල්ල - අනුරාධපුර දක්වා ) - රු. 2915.00

**32.** **ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, ගා/ නාගොඩ**

i. 2019 ජුනි මස 11 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (තේ සඳහා) - රු. 2667.00
ii. 2019.06.27 දින පැවැත්වූ තාක්ෂණ ඇගයීම් කමිටුවේ සංග්‍රහ වියදම් බිල්පත - රු. 321.80

**33.** **ආර්. ඒ. රංජිත් මානෙල් මයා, සීගිරි හොටෙල්, නාගොඩ**

i. 2019 ජුනි මස 11 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (කෑම සඳහා) - රු.3010.00

**34.** **කෙත්සිරි කමියුනිකේෂන්, තල්ගස්වල**
පෙර පාසල් සහ පුස්තකාල සඳහා අයදුම්පත් මුද්‍රණ ගාස්තු - රු. 27440.00

**35. ඔරියන්ට් ඉලෙක්ට්‍රිකල්ස්, කොළඹ 10**
වීථි පහන් උපකරණ මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 37000.00

**36. ආසිරි ටයර් ට්‍රේඩර්ස්, ඔටෝ සර්විස්, ගාල්ල**
කොම්පෝස්ට් අංගනයේ හලන යන්ත්‍රයට සවි කරන ලද බෙල්ට් සඳහා මුදල් ගෙවීම - රු. 1590.00

**37. අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස් පුද්. සමාගම, පිටිගල**
වීථි පහන් උපකරණ මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු.101000.00
(බල්බ්, වයර් රෝල්, CFL බල්බ්)

**පොදු අරමුදල් කර්මාන්ත**
**38. පී.ජී. සමන්ත මයා, පී ජී බ්ලොක් ගල්**
ඌරල පහල ආරලිය මාර්ගය කාණු කපා දෙපස පිළිසකර කිරීමට බැකෝ යන්ත්‍ර යොදා ගැනීමේ වියදම - රු. 12500.00

**රජයේ ආධාර (මන්ත්‍රී ප්‍රතිපාදන) - 2018**
**39. ඉසුරු දොඩංගොඩ මැතිතුමාගේ ප්‍රතිපාදන**
සී/ස බද්දේගම ප්‍රාදේශීය සමුපකාර සමිතිය, පුහුල්දූව, බද්දේගම
මාරකන්ද අලුත් ගම්මාන පාරට සිළිංඩර් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම - රු. 19500.00

**රජයේ ආධාර**
**පළාත් නිශ්චිත - 2018**
**40. කුරුපනාව ගොවි සංවිධානය, කුරුපනාව, නාගොඩ**
උඩුගම පුස්තකාලයේ ජල සැපයුම හා සනීපාරක්ෂක වැසිකිළි පද්ධතිය ස්ථාපනය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් ගෙවීම - රු. 980379.87

**අංක 01 සිට 40 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**(ඉ) 2.1. 01. ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. ලෙහුවල ශ්‍රී රේවත මහා විද්‍යාලය අසලින් ඇති කාපාලමත්තකදූව මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම
ii. ලෙහුවල හල්දොලකන්ද පොදු නාන ළිඳ අළුත්වැඩියා කිරීම
iii. ලෙහුවල සී.කේ.ඩබ්.ජයසේකර මහතාගේ නිවස අසළ පොදු නාන ළිඳ අළුත්වැඩියා කිරීම

**ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**02.** ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

i. කොළඹ කඩේ සිට තල්ගස්වල දක්වා මාර්ගයේ අබලන්ව පවතින පාලමක් වන කුඹුස්ස පාලමේ පැති බැම්ම ගැල වී ඇති අතර එය ප්‍රතිසංස්කරණය කිරීම
ii. 215 බී අලුත් පහළ බටහිර ග්‍රාම නිලධාරී වසමේ රාත්‍රී කාලයේදී ඉතා කළුවර වීථි ලාම්පු අත්‍යාවශ්‍ය ස්ථාන කිහිපයක් සඳහා වීථි ලාම්පු 07 ක් සවි කිරීම
iii. කුඹුරුහේන ප්‍රදේශයේ ළමා උයනක් ස්ථාපිත කිරීමට ඉඩම් කැබැල්ලක් ඇත. එහි ළමා උයනක් ස්ථාපිත කර දීම

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

i. උඩවැලිවිටිතලාව ගල්ලෙනමුල්ල කොණ්ඩුගොඩ මාර්ගය සංවර්ධනය කිරීම -රු. 20000.00
ii. මාමණ්ඩදොල වතු ක්‍රීඩාංගණය මැද මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 7500.00
iii. ගම්මැද්දේගොඩ කන්දකැටිය මාර්ගයේ අබලන් වූ කොටසක් කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම - රු. 20000.00
iv. උඩුගම කැටගොඩ ඉඹුල්කොටුකන්ද පාර සංවර්ධනය කිරීම - රු. 500000.00
v. උඩුගම දකුණ පියතිලක මාවත මිනිරන්වල කන්ද මාර්ගය සංවර්ධනය කිරීම - රු. 7500.00

**ඉහත සඳහන් මාර්ග සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

vi. සෙනවිරත්න මාවත අසළ දෙවැනිගවත්ත තොටුපල සංවර්ධනය කිරීම - රු. 60000.00
vii. 217 සී ගම්මැද්දේගොඩ නව පාළම අසළ තොටුපල සංවර්ධනය - රු. 150000.00

**ඉහත සඳහන් තොටුපලවල් සංවර්ධනය සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

viii. කොම්පෝස්ට් අංගනයේ නොදිරන කසල බැහැර කරනු ලබන ස්ථානය අළුත්වැඩියා කිරීම - රු. 27500.00

**කොම්පෝස්ට් අංගනයේ නොදිරන කසල බැහැර කරනු ලබන ස්ථානය අළුත්වැඩියා කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

ix. MP 2001 L ගෙස්ටෙට්නර් ජායා පිටපත් යන්ත්‍රයට අවශ්‍ය කොටස් අලුතින් යෙදීම සඳහා ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පීඑල්සී වෙතින් එවා ඇති ඇස්තමේන්තුව - රු. 37202.50

**ජායා පිටපත් යන්ත්‍රයට අවශ්‍ය කොටස් අලුතින් යෙදීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව සභාව පිළිගත යුතු බවට ගරු ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

<u>මාපලගම උප කාර්යාලයට හා උඩුගම උප කාර්යාලයට ඇඟිලි සළකුණු යන්ත්‍ර 02 ක් සවි කිරීම සඳහා ලැබී ඇති මිළ ගණන්</u>

| විස්තරය | සවුත් නෙට් ටෙක්නොලොජී පුද්.සමාගම,වක්වැල්ල , ගාල්ල | ෆියුචර් ෆයින්ඩ්ස්, වක්වැල්ල, ගාල්ල | ෆින්කෝ ටෙක්නොලොජී , ගාල්ල | සෙල් එක්ස් කම්පියුටර්ස්, කිතුලම්පිටිය, ගාල්ල |
|---|---|---|---|---|
| • ඇඟිලි සලකුණු යන්ත්‍රය | රු. 24500.00<br>2 year warranty | රු. 29500.00<br>2 year warranty | රු. 27500.00<br>2 year warranty | රු. 21900.00<br>2 year warranty |
| • බැටරි සහ සවිකිරීම් සඳහා | රු. 8500.00 | රු. 6500.00 | රු. 9000.00 | රු. 7400.00 |
| එකතුව | රු. **33000.00** | රු. **36000.00** | රු. **36500.00** | රු. **29300.00** |

**ඇඟිලි සළකුණු යන්ත්‍ර 02 ක් මිළදී ගැනීම සහ සවි කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල සෙල් එක්ස් කම්පියුටර්ස්, කිතුලම්පිටිය, ගාල්ල වෙතින් ඇඟිලි සළකුණු යන්ත්‍ර 02 මිළදී ගෙන සවි කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල සෙල් එක්ස් කම්පියුටර්ස්, කිතුලම්පිටිය, ගාල්ල වෙතින් ඇඟිලි සළකුණු යන්ත්‍ර 02 මිළදී ගැනීම සහ සවි කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

*වීථි පහන් අළුත්වැඩියාව සඳහා අවශ්‍ය තම්බ්ලර් ස්විච් මිළදී ගැනීම සඳහා මිළ ගණන්*

| විස්තරය | නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ, ගාල්ල | ලක්දිව් එන්ටර්ප්‍රයිසස්, උඩුගම පාර, කොට්ටවගම | සේතිරි හාඩ්වෙයාර්, තල්ගම්පල, ගාල්ල | අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස්, පිටිගල |
|---|---|---|---|---|
| • *තම්බ්ලර් ස්විච්* | රු. 140.00 | රු. 145.00 | රු. 148.00 | රු. 150.00 |

*වීථි පහන් අළුත්වැඩියාව සඳහා අවශ්‍ය තම්බ්ලර් ස්විච්* මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ, ගාල්ල වෙතින් *තම්බ්ලර් ස්විච්* මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ, ගාල්ල වෙතින් *තම්බ්ලර් ස්විච්* මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී එන්.ඩබ්. පතිනායක මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.

***PF 7360** කැබ් රථයට **95 DL** ඇමරෝන් බැට්රිය මිළදී ගැනීම සඳහා මිළ ගණන්*

| විස්තරය | නිව් විජය මෝටර්ස්, ගාල්ල | ගෝල් බැටරි හවුස්, ගාල්ල | හසිත ටයර් සර්විස්, ගාල්ල |
|---|---|---|---|
| • 95 DL ඇමරෝන් බැට්රිය | රු. 18700.00 | රු. 18900.00 | රු.19000.00 |

***PF 7360** කැබ් රථයට **95 DL** ඇමරෝන් බැට්රිය* මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල නිව් විජය මෝටර්ස්, ගාල්ල වෙතින් ***95 DL** ඇමරෝන් බැට්රිය* මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල නිව් විජය මෝටර්ස්, ගාල්ල වෙතින් ***95 DL** ඇමරෝන් බැට්රිය* මිළදී ගැනීම සුදුසු බව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.

*සෞඛ්‍ය කම්කරුවන් සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීම සඳහා මිළ ගණන්*

| **විස්තරය** | **සී/ස රජයේ වානිජ (විවිධ) නීතිගත සංස්ථාව** | | |
|---|---|---|---|
| • බූට්<br>• වැහි කබා<br>• ප්ලාස්ටික් හෝස් | රු. 2870.00<br>රු. 1500.00<br>රු. 2600.00 | | |

***සෞඛ්‍ය කම්කරුවන් සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීම සඳහා*** **අඩුම මිළ ගණන් ඉදිරිපත් වී තිබූ සී/ස රජයේ වානිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙතින් එම උපකරණ මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

*සමාන්තර දූරකථන සම්බන්ධතාවයක් ලබා ගැනීම සඳහා මිළ ගණන්*

| **විස්තරය** | **ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී** | | |
|---|---|---|---|
| • Prolink HCD 303 | රු. 2750.00 | | |

***සමාන්තර දූරකථන සම්බන්ධතාවයක් ලබා ගැනීම සඳහා*** **අඩුම මිළ ගණන් ඉදිරිපත් වී තිබූ ශ්‍රී ලංකා ටෙලිකොම් පී. එල්. සී. වෙතින් එම උපකරණ මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී එන්.වී සමන් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**(ඊ) කාරක සභා වාර්තා**

- 2019.06.24 දින නාගොඩ ප්‍රාදේශීය සභාවේ පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2019 මැයි මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය සළකා බැලීම සඳහා ජූලි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2019 ජුනි මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය සළකා බැලීම සඳහා ජූලි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2019 ජුනි මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරාංශය සළකා බැලීම සඳහා ජූලි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2019 ජුනි මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් සළකා බැලීම සඳහා ජූලි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

- **ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ප.ව. 12.45 ට පමණ සභා රැස්වීමට සහභාගි වන ලදී.**

## 11.වෙනත් කරුණු :-

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු සභාවේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනා සිහිපත් කරමින්, අද දවසේ සභාවාරය අවසන් කරන්න බලාපොරොත්තු වුණත්, වැදගත්ම අවශ්‍යතාවයක් පිළිබඳව කෙටි සඳහනක්න කරන එක මගේ යුතුකමක් වෙනවා. ඒ ගැන කෙටි සඳහනක් කරලා මම අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මතක් කරන්න ඕන. ගරු සභාපතිතුමනි, තල්ගස්වල බදාදා සතිපොල පිළිබඳව, නාගොඩ ප්‍රාදේශීය සභාව යටතේ තියෙන පොළක් වශයෙන් ඒ සඳහා නිසි අවධානයක් යොමු කරන්නේ නැහැ කියලා අපට විවිධ මට්ටමෙන් චෝදනා එල්ල වෙනවා. අපි හැමදාම මාපලගම පිලිබඳවත්, බදාදා සතිපොළ පිළිබඳවත් කතා කරනවා. හැබැයි මේ ප්‍රශ්න දිනෙන් දිනම උග්‍ර වෙමින් පවතිනවා. උඩුගම සතිපොළ සඳහා යම් මුදලක් ලැබෙන්න තියෙනවයි කියලා සභාපතිතුමා ප්‍රකාශ කලා. ඒ වගේම මේ තල්ගස්වල සති පොළටත් ඒ වගේ ලොකු මුදලක් අරගෙන යම් මට්ටමකට අපේ ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවයන් සපුරන ස්ථානයක් හැටියට හොඳට සංවර්ධනය කරන්න අවශ්‍යයි. විශේෂයෙන්ම මම ගිය සතියෙ බදාදා පොළට ගිය අවස්ථාවේ, කිහිප දෙනෙක් ඇවිල්ලා කිව්වේ සභාවේ මන්ත්‍රීවරුන් හැටියට ඔබතුමන්ලා සභාවෙ හිටියත්, බලන්න මේ පොලේ හැටි, මෙහෙම ගියොත් තව මාස කිහිපයක් යන විට මොන තත්වයක් උදා වෙයිද කියලා එතුමලා හේතු සාධක සහිතව එක්කගෙන ගිහිල්ලා ඒ ඒ තැන් වලට ගිහිල්ල පෙන්නුවා. ඉතිං ඇත්තටම ඒ අවස්ථාවේදී අපට දෙන්න පිළිතුරක් නැහැ. ගරු සභාපතිතුමනි, අපි මොනව හරි කරලා, වත්මන් රජයේ විශේෂ වැඩසටහනක් යටතේ පහුගිය කාලේ විවිධ ඉල්ලීම් කරපු අවස්ථාවලදී අපි ඒ අවශ්‍ය තැන්වලට යෝජනා කරලා තියෙනවා. මේ වෙලාවේ විශේෂයෙන්ම සඳහන් කරන්න ඕන කානු පද්ධතිය වගේම වහල ගැන. දැන් වහල හොඳටම දිරලා. තව ටික දවසකින් වෙළෙන්දන්ගේ ඔලුව උඩ තමයි වහල නවතින්නේ. මොකද පහුගිය කාලේ කරපු අවිධිමත් ව්‍යාපෘති නිසා, ප්‍රමිතියක් නැති දේවල් වලින් කරපු කර්මාන්ත නිසා දැන් දිනෙන් දින ශ්‍රීඝ්‍රයෙන් අබලන් වී ගෙන යනවා. ඒ වගේම පොලේ විදුලි පද්ධතිය ගැන මට කිව්වා. මේ තියෙන තත්වෙත් එක්ක ඒ විදුලි වයර් ගැලවිලා එක එක තැන්වල ලනු වලින් ඇදලා ගැටගහපු තත්වයක් තියෙන්නේ. ඉතින් මෙහෙම ගියොත් පොළට එන මිනිස්සු කරන්ට් එක වැදිලා මැරේවි කියා ඒ මිනිස්සු ප්‍රකාශ කරනවා. එනිසා අපි තාවකාලික පිළියමක් හැටියටවත්, අපේ සභාවේ විදුලි කාර්මික නිලධාරී යොමුකරලා, වීපී පහන් අලුත් වැඩියා කිරීම ටිකක් නතර කරලා, මේ දහස් ගණනක් මිනිස්සු ගැවසෙන තල්ගස්වල බදාදා සතිපොළේ විදුලි පද්ධතිය යම් මට්ටමකට හරි ජනතාවට හිරිහැරයක් නොවන විදිහට හදන්න පුලුවන්නම් හොඳයි කියලා මම කියනවා. මොකද අපේ ප්‍රදේශයේ ජනතාවම තමයි චෝදනා එල්ල කරන්නේ. මේවා නිසියාකාරයෙන් පිළිසකර කරන්න අපේ සභාවට ලොකු ආදායම් මට්ටමක් නැති එක ඇත්ත. නමුත් හැකි ශක්ති ප්‍රමාණයෙන් හරි මේ කටයුත්ත ඉක්මනට කරන්න ඕන.

ඒ වගේම පොලේ යම් යම් ස්ථාන මත්කුඩු ජාවාරම්කාරයන්ගේ භූමියක් වෙලා තියෙනවා. මොකද පොල එහා පැත්තෙ චයිනීස් රෙස්ටුරන්ට් එකක් තියෙනවා. ඒ පැත්තෙ මහ කැලෑවක් තියෙන්නේ. සමහරක් මිනිස්සු මේ සඳහා යොමුවෙලා තියෙනවා කියලා කියනවා. ඒ නිසා මේ සභාවෙන් ඉන්න කම්කරුවන් යොදවලා යම් මට්ටමකට හරි ඒ කැලෑ සුද්ද කරලා, යම් මට්ටමකට එළිපෙහෙළි කරලා කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මාපලගම මංසන්ධියේ කරුණාතිලක ක්‍රීඩා පිටිය පහුගිය දවස් වල පිළිසකර කලා. මම ඒ අවස්ථාවේදී අපේ කම්කරු මහත්තරුන්ට කිව්වේ, වටේ තියෙන මහා ගස්වල පිට්ටනියට නැවිලා තියෙන අතු සම්පූර්ණ කපලා ඉවත් කරන්න කියලා. කාලය ටිකක් වැය වුණත්, හැමදාම මේ පිට්ටනිය

සුද්ද කරන්නෙ නැති නිසා, ඒ කරන කටයුත්ත නිසියාකාරයෙන් කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම මම අහන්න කැමතියි. ගරු සභාපතිතුමා, අර මාපලගම නගරයේ පොදු වැසිකිළි පද්ධතිය පිළිබඳව. පහුගිය දවස්වල නිලධාරීන් ඇවිත් අවශ්‍ය තොරතුරු අරගෙන ගියා. ඉදිරි ක්‍රියාමාර්ග කොහොමද? මොකද්ද ඒ කර්මාන්තයට සිද්ධ වෙන්නෙ? මේ අවුරුද්දේ වත් ආරම්භ කරන්න පුළුවන් වෙයිද කියලා අපිව දැනුවත් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම සභාපතිතුමනි, ප්‍රදේශයේ තියෙන අතුරු මාර්ග පිළිබඳව විවිධ ගැටලු තියෙනවා. මේ හැමදේටම උත්තරය තමයි. අපට අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණවත්ව නොමැතිකම. මම ගිය සභාවෙත් කිව්වා වගේ, තණකොළ කපන යන්ත්‍ර කිහිපයක් හරි අරගෙන, අපේ කම්කරුවන් යොදවලා කරන්න පුළුවන්. දැනට මාර්ග සංවර්ධන අධිකාරිය, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියත් දෙගොල්ලොම පාරවල් එළිපෙහෙළි කරන්නේ මැෂින් වලින්. ඉතින් ප්‍රාදේශීය සභාව හැටියට සභාව යටතේ තියෙන ගම්වල අතුරු මාර්ග එළිපෙහෙළි කිරීමේ කටයුත්ත කරන්න ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මේ වෙලාවේ ඉල්ලා සිටිනවා.

ඒ වගේම මාපලගම පොදු වෙළඳ සංකීර්ණයේ උඩුමහලේ අංක තුන කඩකාමරය ගැන මම පහුගිය දවස්වලත් කතා කළා. සභාවට අය කරන බදු මුදලේ ප්‍රමාණය වැඩි කරල තියෙනවා. නමුත් ඒ අයට අවශ්‍ය පහසුකම් ලබා දෙන්නේ නැහැ කියලා චෝදනාවක් තියෙනවා. මේ සභාවට පත්තර දෙන රත්නසිරි ස්ටෝර්ස් කඩේ අය ටෙන්ඩරයක් මගින් උඩු මහළේ කාමරයක් අරගෙන තියෙනවා. නමුත් එහි විදුලිය අක්‍රිය කරලා තියෙන්නේ. විදුලි බිල් ගෙවන්නේ නැතුව විදුලිබල මණ්ඩලයෙන් ඇවිත් මීටරයත් ගලවගෙන ගිහිල්ලා තියෙනවා. ඒ අය කිහිපවිටක්ම ඒ ගැන මේ සභාවට දැනුම් දීලා තියෙනවා. ඒ අයට ව්‍යාපාරය පවත්වාගෙන යන්න ඒ කඩකාමර ද විදුලිය ලබා දෙන්න කියලා ඉල්ලීම් කරල තිබුනත්, මේ වන තෙක් විදුලිය ලබාදීලා නැහැ. මම ගිය සභාවෙ කිව්වා වගේ, ඒ අයට බදු මුදල් ගෙවන්න නම් යම් ආදායමක් හොයාගන්න වෙනවා. ඒ ආදායම හොයන්න නම් ඒ කඩ කාමරය පාවිච්චි කරන්න වෙනවා. පාවිච්චි කරන්න හැකියාවක් නැතුව ඒ අය තමන්ගේ අතින් තමයි සභාවට බදු මුදල් ගෙවන්නේ. ඉතින් ඔබතුමාගේ අවධානය යොමු කරලා, ඒ කඩ කාමරයට විදුලිය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද ඒ අය කැමති නැහැ සභාව නමින් මුදල් ගෙවලා විදුලිය ගන්න. සභාවෙන් ඒ අයට කියලා තියෙනවා. සභාවෙ නමින් විදුලිය ගන්න කියලා. මෙතන තියෙන්නේ ඒ අයගෙ වැරැද්දක් නෙවෙයි. සභාවෙන් සිදු වෙච්ච වැරැද්දක්. බිල් නොගෙව්වට පස්සේ විදුලිබල මණ්ඩලයෙන් මීටරය ගලවගෙන ගිහිල්ලා තියෙනවා. එනිසා නැවත වාරයක් ඔබතුමා මැදිහත්වෙලා, විදුලිබල මණ්ඩලයට කියලා, විදුලිය ලබා දෙන්න කටයුතු කරන්න. මේ සඳහා ලොකු මුදලක් ගෙවන්න වෙන එකක් නැහැ. හිඟ බිල්පත් තියෙනවනම් ගෙවන්න වේවි. මම හිතන්නේ ඒ බිල්පත් ඒ අය ගෙවල තියෙන්නෙ. ඉතින් මේ පිළිබඳව ඔබතුමා සොයා බලා, ඒ කටයුත්ත ඉෂ්ට සිද්ධ කර දෙන්න කියලා ඉල්ලා සිටිමින්, අද දවසේ මගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරනවා. ඔබ සියලු දෙනාටම තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ලක්රුවන් මන්ත්‍රීතුමාගේ නඩුවට සභාවෙන් මුදල් ගෙවීම සම්බන්ධව සභාවේ කිසිඳු මන්ත්‍රීවරයෙකුගේ විරෝධතාවයක් නොමැති බැවින් එතුමා පොදු කටයුතුතක් සඳහා ඉදිරිපත් වෙලා තියෙන්නෙ. ඒ නිසා සභාව මගින් නඩු ගාස්තු ගෙවීම සුදුසු යැයි මම යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.කේ.අයි නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන්, මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. මමත් පොඩි වෙලාවක් ගන්නවා. මොකද අද අර පාර සම්බන්ධ ලිපියක් එවලා තිබුණා. ඒ පිළිබඳව මම ගිය මාසේ

කතා කළා. නමුත් ඒ ගැන සිදුවුණේ මොකක්ද කියන එක මම දන්නෙ නැහැ. නැවත දැන් ඒක සංවර්ධනය කරපු නිසා තමයි. අද ඒ ලිපිය එවල තියෙන්නේ. ආයෙත් ලබන මාසයේ අපි එන අවස්ථා වනවිට එතන තාප්පේ ගහලා පාර අවහිර වෙන්න පුළුවන්. ඒක නිසා ඒ ගැන සොයා බලා පාර ඒ අඩි ගණන වෙන් කරලා මනින්න පුළුවන් නම් එතකොට දෙපැත්තෙම අරගලය විසඳෙනවා. ඒ ගැනත් මතක් කරනවා.

ඒ වගේම ලක්රුවන් සම්පත් මහත්මා අදත් අර නඩුව සම්බන්ධව උසාවි ගිහින් තියෙනවා. ඉතිං එතුමා ඒ නඩුව සම්බන්ධයෙන් සැහෙන පීඩනයකට පත් වෙලා ඉන්නවා. ඒ නිසා අපේ සභාවේ මන්ත්‍රීවරුන් ඒ ගැන කතාබහ කරලා, ඔහුට විසඳුමක් දෙන්න පුළුවන් නම් ඒක ලොකු උපකාරයක් වෙනවා. එවිට ඒ පීඩනයෙන් ඔහුට මිදෙන්න පුළුවන් වෙනවා. ඒ ගැන සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා**

ගරු සභාපතිතුමනි 1991 වර්ෂය පටන් ගත්ත උනන්විටිය සති පොල ලොකු සති පොළක් බවට පත්වෙලා තිබුනා. නමුත් දැනට අපට පුංචි ප්‍රමාණයක් තමයි ඉතිරි වෙලා තියෙන්නෙ. ඒ නිසා එම පොළ වැඩිදියුණු කරන්න කියලා මම යෝජනා කරනවා. ජලය නැතිකමින් පොළේ අපිරිසිදු තාවය වැඩි වෙලා තියෙනවා. ඒ සඳහා ජලය දෙන්න හදා මහත්මියලගේ ලිඳෙන් ජලය දෙන්නම් කියා ප්‍රකාශ කලා. අනිත් එක දැන් මුල්ලකට ආපු නිසා දැඩි කළුවරක් තියෙනවා. වීපී ලාම්පුවක් ඒ පැත්තට හරවල දැම්මොත් හොඳයි කියල මම යෝජනා කරනවා.

අනිත් එක උනන්විටිය ග්‍රාමසේවා කොටසෙ තියෙන කුකුල්වැල්දූව පාර ඉස්සෙල්ලා සභාවකින් කොන්ක්‍රීට් කරලා, ප්‍රතිසංස්කරණය කරපු පාරක්. නමුත් මැදදී මීටර් 500ක පමණ කොටසක් ඉතුරුවෙලා තියෙනවා. ඒ ප්‍රදේශයේ පවුල් දහයක් විතර පදිංචි වෙලා ඉන්නවා. පොඩි ගංවතුරට වුණත් යට වෙනවා. මම පහුගිය යෝජනා වලටත් මේ මාර්ග ඇතුලත් කරලා තිබුණත්, මුදල් මදිකම නිසා ඒක අතපසු වෙලා තියෙනවා. ඒ කුකුල්වැල්දූව මාර්ගයට පස් දමා ගොඩ කරන්න කියලත් මම මේ අවස්ථාවේ යෝජනා කරනවා. එහා පැත්තෙන් පාරක් තියෙනවා. ඒ පාරට යා කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමාගෙන්ද, සියළුම මන්ත්‍රීවරුන්ගෙන්ද අවසරයි. දිසානායක මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරමින්, ගරු සභාපතිතුමනි මට කාරණා දෙකයි කතා කරන්න තියෙන්නේ. පළමුවෙන්ම අපේ වනමල් මන්ත්‍රීතුමා තල්ගස්වල පොළ පිළිබඳව කතා කලා. මම හිතන්නේ තව ටික දවසකින් තල්ගස්වල බස් නැවතුම්පොළට උඩින් අක්ෂි රෝහලක් හැදෙනවා. ඒ නිසා තල්ගස්වල නගරය මීට වැඩිය දියුණු වෙයි. ඒ වගේම මම දැක්කා අනවසර ඉදිකිරීම් කරලා තියෙනවා. මාළු ලැල්ලක් බැඳලා හදලා තියෙනවා. මම දන්නෙ නැහැ ඒක කලේ කවුද කියලා. අපේ පාක්ෂිකයෙක් ද කියලවත් මම දන්නේ නැහැ. නමුත් මෙහෙම තත්ත්වයක් සිදුනොවිය යුතුයි. එහෙම තත්ත්වයකට පත්වෙන්න දෙන්න හොඳ නැහැ. අඩුම තරමේ ඒ මනුස්සයා ලැලි කෑලි හතරක් තියලා කණු හතරක් ගහලා කරගන්නවා නම් කමක් නැහැ. සිමෙන්තියෙන් බැඳලා තිබුණේ. ඒ නිසා මේ අනවසර ඉදිකිරීම් කරන එක යම් මට්ටමකට නවත්ත ගන්න තමුන්නාන්සෙ කටයුතු කළොත් හොඳයි. මොකද නැත්නම් තල්ගස්වල නගරය තව පුංචි වේවි. අද වනකොටත් තල්ගස්වල නගරයේ, මාපලගම නගරයේ වාහනයක් නවත්තන්න ඉඩක් නැහැ. කඩේකට ගොඩ වෙන්න විදියක් නැහැ. නමුත් වෙළඳ මහත්වරු හිතාගෙන ඉන්නේ කඩ හදාගත්තම ව්‍යාපාර කරන්න ලේසියි කියලා. ව්‍යාපාර කරන්න නම්, වාහනයක් නවත්වලා බඩුවක් ගන්න අවස්ථාව තියෙන්න ඕන. නමුත් එයාලට ඒ ගැන තේරෙන්නේ

නැහැ. ඒ නිසා ඔබතුමාට තියෙන බලතල පාවිච්චි කරලා ඒ කටයුතු කරන්න. මේ බලතල, සභාවෙ ඉන්න කවුරුවත් ගණන් ගන්නේ නැහැ. RDA එක ගණන් ගන්නේ නැහැ. මිනිස්සු කැමති කැමති විදිහට කැමති කැමති දේවල් කරගන්නවා. ඒ වගේම තල්ගස්වල නගරයේ පාලමෙන් එහා පැත්ත ශ්‍රීඝ්‍රයෙන් දියුණු වෙනවා. නමුත් අපි මේ පැත්ත දියුණු කරන්න කියලා හිතලවත් නැහැ. ඒ වෙනුවෙන් මොනවත් කරල නැහැ. ගල්ලිද හන්දිය ලග මේ වෙනකොට බැංකු තුනම ඒ පැත්තට ඇදලා ගත්තා. මාපලගම තිබුණු බැංකුවත් ඒ පැත්තට ඇදලා ගත්තා. ඒ නිසා ඒ අය ඒ පැත්ත දියුණු කරගන්නවා. මේ පැත්ත ගැන හිතලවත් නැහැ. අපේ ඉඩම් ආරක්ෂා කරගන්න මොනව හරි කරන්න ඕන. අපි කට්ටියත් එක්ක කතා කර කර ඉන්නවා. සියලු දේ මෙහෙන් ගැලවී ගැලවී නියාගම ප්‍රාදේශීය සභාවට යනවා. මේ වෙනකොට මේ පැත්තට වඩා ඒ පැත්ත දියුණු වෙලා තියෙනවා. පාලමෙන් එහා පැත්තෙ කඩ කාමර කුලී වැඩිවෙලා. නමුත් තල්ගස්වල මේ පැත්තෙ තිබ්බ්ච තත්වය තවත් පහලට ගිහිල්ලා තියෙනවා. ප්‍රධාන මධ්‍යස්ථානය වන පොළ අපේ පැත්තෙ තිබුණත්, තවම දියුණු වෙමින් පවතිනවා. මේ පිළිබඳව අවධානය යොමු කරලා රජයෙන් ගන්න ඉඩමක් හරි අපි අරගෙන මොනව හරි ක්‍රමවේදයක් හදලා තල්ගස්වල මීට වැඩිය ඉහලට ගෙන්න කටයුතු කරන්න. නැත්නම්, අපේ සියලුම ව්‍යාපාර ස්ථාන නැතිවෙලා පොළ භූමිය විතරක් ඉතුරු වේවි. නියාගම ප්‍රාදේශීය සභාවෙන් පොළ ඒ පැත්තෙ දාන්න පුලුවන්ද කියලා සොයලා බලලා තියෙනවා. එහෙම දැම්මොත් අපේ නාගොඩ ප්‍රාදේශීය සභාවට තියෙන පළවෙනි ආදායමත් අපට ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා පෞද්ගලිකව මේ ගැන කල්පනා කරලා අනවසර ඉදිකිරීම් නවත්වලා, යම් මට්ටමකින් හරි පාලනය කරලා කටයුතු කරන්න ඔබතුමාගේ හිතේ ඇති යමකක් කරන්න. කොහොම නමුත් මේ කාර්යයන් ඉක්මනින් කළේ නැති වුනොත්, අපේ තල්ගස්වල තියෙන දියුණුව නැතිවෙලා සම්පූර්ණ ව්‍යාපාරික අයිතිය සියල්ල පාලනය එහා පැත්තට යයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ගරු වජිර අබේවර්ධන ඇමැතිතුමා, මේ වෙනකොට ප්‍රජා ජල යෝජනා වැඩසටහන් සමඟ වැඩ කටයුතු කරමින් තියෙන වෙලාවේ එතුමා සහබන්දු මහත්තයා ඇතුළු අපි සියලු දෙනාටම කිව්වා. අපට ආදායමක් එන විදියට මම හදලා දෙන්නම් කියලා. ඊළඟට තියෙන හැම ජල යෝජනාවකම සම්පූර්ණ බලය දෙන්නේ ප්‍රාදේශීය සභාවට. නමුත් මෙච්චර කාලයක් ඒ දේ සිද්ධ වුණේ නැහැ. මේ මාසය ඇතුළත ජල යෝජනා ක්‍රම තුන හතරක්ම මුල්ගල් තියනවා. සියලු යෝජනා ක්‍රමවල බලය ලබාදීලා තියෙන්නේ ප්‍රාදේශීය සභාවට. ආදායමක් ලබාගන්න විදිහකට වතුර කියුබික් මීටරයට ගානක් හදලා අපට ආදායමක් එන්න හදලා තියෙනවා. බුදපනාගම, හෝමදොළ, නාගොඩ ඉහළ මේ සියලු ජල ව්‍යාපෘතිවල සම්පූර්ණ බලය අපට ලබාදීලා සභාවට ආදායමක් එන්න කටයුතු කිරීම ගැන අපේ වජිර අබේවර්ධන ඇමතිතුමාට ස්තුතිවන්ත වෙමින්, සියලු දෙනාට සුභ දවසක් කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මමත් මේ වෙලාවේ වැදගත් යෝජනාවකට මුලපුරන්නේ. අපි දීර්ඝ වශයෙන් කතා කරලා තවමත් ක්‍රියාත්මක කරන්න බැරි වුණ ආදාහනාගාරය පිළිබඳව යෝජනාවක් මම ගේන්නේ. අපේ නන්දන මන්ත්‍රීතුමා කිව්වා වගේම පළාත් පාලන අමාත්‍යවරයා හැටියට ගරු වජිර අබේවර්ධන ඇමතිතුමා කිව්වා යෝජනාවක් ස්ථිර කරලා දෙසැම්බර් 31 ට කලින් එවන්න කියලා. ඉඩම් අමාත්‍යවරයා යටතේ ඉඩම් කොටස් පවරා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක වුණොත් අනිවාර්යයෙන්ම නාගොඩ ප්‍රාදේශීය සභාවට කෝටි දෙකක් දෙන්න එතුමා එකඟතාවය පළ කළා. මේ ආදාහනාගාරය ප්‍රදේශයට අත්‍යවශ්‍ය දෙයක්. නමුත් දැන් තමුන්නාන්සේලා හිතාවි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තියෙන්නේ. පොහොට්ටුවෙ එහෙම නැත්නම් පොදු පෙරමුණේ ප්‍රාදේශීය සභා තියෙනකොට, අපි මේ මොහොත වෙනතෙක් කිසිම කටයුත්තක කකුලෙන් ඇදලා නැහැ. මම

ගිය සැරේ සභාවාරයට දාන්න තමයි බලාපොරොත්තු වුනේ. ඒ නිසා අපි සියලු දෙනාගේම ඒකමතිකව සම්මත වී ඉක්මනින් කරන්න ලැබේවා කියලා මම කියනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න.

ඒ වගේම මේ මොහොත වෙනකොට ප්‍රාදේශීය සභාවට කරගන්න බැරි වුණ දේවල්, අද වෙනකොට ඉතිහාසය වෙනස් කරමින් නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තියෙන අතුරු මාර්ගවලට, මධ්‍යම ආණ්ඩුව හැටියට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව හැටියට, අග්‍රාමාත්‍යවරයාගේ ඒ වගේම කබීර් හෂීම් ඇමැතිවරයාගේ සංකල්පයක් මත මේ මොහොත වනවිට අපි එක් කෝටි තිස් ලක්ෂයේ ඒවා හයක් විතර නාගොඩ බලප්‍රදේශයට ගෙනත් තියෙනවා. එතකොට කෝටි අටකට ආසන්න ප්‍රමාණයක්. අපි කුහකකම් කරනවා නම්, අපි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් හැටියට අපට අවශ්‍ය දේ අපිත් මේකට උනන්දු වෙලා මේ මොහොත වෙනකොට අගෝස්තු 31 වනදා වන විට පාරවල් හයේම කටයුතු අවසාන කරනවා. මේ මොහොත වනවිට සමහර පාරවල් වලට ගල් ගෙනැල්ලා. ABC බාලා තියෙනවා. ඉතින් ඒ නිසා අපි රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියටත් මේ සහයෝගය දීලා මේ සියලු කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. සභාවට එන විට අපි පොරොන්දුවක් දුන්නා. අපේ ආණ්ඩුවක් තිබුණත්, නැතත් ප්‍රාදේශීය සභා නියෝජිතයෙක් හැටියට ප්‍රදේශයේ මහජනතාවට සේවය කරනවයි කියලා. කියන්න කණගාටුයි මන්ත්‍රීතුමා, ඔබතුමා අපි බොරු කියනවා නම් ගිහිල්ලා බලන්න. දැන් සංවර්ධනය වෙමින් පවතිනවා. ඒකට සතුටු වෙන්න ඕනේ. දැන් මෙතුමා වැදගත් යෝජනා ගේනවා. මෙතුමා හරි මාර්ගයේ යන්න තමයි සෑම යෝජනාවක්ම කරන්නේ. තමුන්නාන්සේලා පහලොස් දෙන එක පැත්තකට බෙදලා නැහැ. අපි විසි හත් දෙනාම ඒ වෙනුවෙන් අත උස්සන්න තමයි ඒ යෝජනාව ගෙනාවෙ. ඒ වගේම සභාපතිතුමා තනි කරන්නේ නැහැ. මේ වගේ සංවර්ධන කටයුතු සිදු කරද්දී සභාපතිතුමා හැටියටත් නාගොඩ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු විදියටත් අපි සියලු දෙනාම සතුටු වෙන්න ඕන. වැඩක් කිරීමේදී, සංවර්ධන කටයුතු කිරීමේදී මේ සියලු දෙයටම අපි සහයෝගය ලබා දෙනවා. මුදල් ප්‍රතිපාදන ගෙවීම්වලදී අපි ඒකෙ අඩුපාඩු පෙන්නනවා. නමුත් අත්‍යාවශ්‍ය දෙයක් නම්, අපි ඒක නතර කරන්න කියලා කියන්නේ නැහැ. ඒකෙ අඩුපාඩු පෙන්නුවෙ නැත්නම් සභාපතිතුමත්, ඔය කණ්ඩායමත්, අපි සියලු දෙනාම අමාරුවෙ වැටෙනවා. ඒකයි නිවැරදි මාවතේ ගෙනියන්න මහන්සි ගන්නෙ. ඒ නිසා පටු තැනින් හිතලා කටයුතු කරන්න එපා. අපි සියලුදෙනාම එකාමෙන් කටයුතු කරන්න අවශ්‍යයි. ඒ වගේම මේ වන විට ගම්පෙරළිය, එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා යටතේ අපේ පළාත්වල කටයුතු ආරම්භ කරලා තියෙනවා. ගම්පෙරළිය යටතේ කෝටි ගානක වැඩ ආරම්භ කරලා තියනවා. මේ සියලු කටයුතු සිද්ධ වෙන්නේ නාගොඩ ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ. ඉතින් සභාපතිතුමාගෙන්, පාලක පක්ෂය හැටියට ඔබතුමන්ලාගෙ ප්‍රශ්න අඩු වෙනවා. එහෙම නම් එම කටයුතු සිදු කිරීමේදී වචනයකින් හරි සියලු දෙනාගේ සහයෝගය ඒ සඳහා ලැබිය යුතු වෙනවා. ඒ පිළිබඳව මම මීට වඩා කතාකරන්න බලාපොරොත්තුවන්නේ නැහැ.

නාගොඩ ප්‍රාදේශීය සභාවේ අපි සභාපතිවරුන් හතර දෙනාම ඉන්න විට ඔය ආදාහනාගාරය සකස් කරන්න මහන්සි ගත්තා. ඒක අපේ සිහිනයක් වෙලා තිබුණා. මේ මොහොත වන විට ගයන්ත ඇමතිතුමාගේ මෙහෙයවීම යටතේ ඉඩම් පවරා ගැනීමට සභාපතිතුමාට සහයෝගය දීලා තියෙනවා. මේ කටයුතු සාර්ථක වුනොත් ඔය 15දෙනා විතරක් නෙවෙයි අපි විසි හත් දෙනාම එදාට එතන කෙලින් හිටගන්නවා. ඒ සතුට මුළු සභාවට අයිති වෙනවා. එදාට මේ විසිහත් දෙනාගෙම නම කියවෙයි. මෙන්න මේ යුගයේදී තමයි මේ දේ සිද්ධ වුණේ කියන එක. ඒක නිසා අපි ඒ කරුණු සැලකිල්ලට අරගෙන තමයි කටයුතු කරන්න ඕන. පටු දේශපාලන පරමාර්ථ අපේ ළඟ තියෙන්න පුළුවන්. ඒව මෙතනට ආවට පස්සෙ අමතක කරන්න ඕන. දේශපාලන පරමාර්ථ එක තැනක. සංවර්ධන පරමාර්ථ තව තැනක. මෙන්න මේකයි සිද්ධ වෙන්න ඕන. නාගොඩ සභාවක් හැටියට සමහර අවස්ථාවල මොන අඩුපාඩු දැක්කත් සභාවක් හැටියට අපි එතනදී කෙලින් හිටගන්න අවස්ථා අපි දැකල තියෙනවා.

ඒ වගේම මම සඳහන් කරන මේ යෝජනාව මගේ පෞද්ගලික යෝජනාවක්. සමහර වෙලාවට පක්ෂයක් හැටියට ගත්තොත් මේකට විරුද්ධයි. වර්තමාන ජනාධිපතිතුමා එල්ලුම් ගහ ක්‍රියාත්මක කළ යුතුයි කියලා හොඳ යෝජනාවක් ගෙනාවා. හතර වටෙන්ම මේකට විරුද්ධයි. නමුත් අපි අපේ අහිංසක දරුවො වෙනුවෙන්, අහිංසක පරපුර වෙනුවෙන්, එල්ලුම්ගහ ක්‍රියාත්මක කරලා එක්කෙනෙක් දෙන්නෙක් එල්ලලා මරන්න ඕන. කියන මතයේ තමයි මම ඉන්නේ. කුඩු ව්‍යාපාරය කරන අය විතරක් නෙවෙයි. අහිංසක දරුවන් දූෂණය කරන පුද්ගලයන්ටත් එල්ලුම්ගහ ක්‍රියාත්මක කරන්න ඕන. මොකද අහිංසක දරුවන්ට පාරක බැහැලා යන්න බැරි කාලයක් තමයි තිබුණේ. ඒ වගේම අපේ පතිනායක මන්ත්‍රීතුමා ගෙන් අහන්න. මේ කුඩු නිසා ඌරල ප්‍රදේශයේ ගෙවල් එක දිගට හොරු කඩාගෙන ගියා. රෑට නිදාගන්න බය හිතුනා. ගෙදර තනියෙන් කාන්තාවක් දාලා යන්න බය හිතුනා. මේකට හේතුව මොකද කියලා හොයලා බැලුවම වෙන මුකුත් නෙවෙයි. මේ කුඩු වලට නැඹුරු වෙච්ච කල්ලියක් තමයි මේ දේ සිදු කළේ. වර්තමානය වෙනකොට වදුරඹ පොලීසිය විසින් මෙය මර්ධනය කරලා තියෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. ඒ වගේම ගෞරවය පුද කරනවා. ඒ නිසා මම හිතනවා. මේක තවත් සංවර්ධනය වෙන්න දුන්නොත්, අපට පාරේ බැහැල යන්න බැරි වේවි. අනාගතයේ අහිංසක දරු පරපුරක් අපට නැති වේවි. අනාගතයේ අපට ජාතියක් නැති වේවි. අන්න ඒ නිසා ජාතිය රැකගන්නත්, ඒ අහිංසක දරු පරපුර රැකගන්නත් මේ කුඩු විකුණන ව්‍යාපාරිකයින් එක් කෙනෙක්, දෙන්නෙක් එල්ලා මරන්න ඕන. පහුගිය දවසක මේ ප්‍රවෘත්තිය දකිනකොට මරණ බය නිසා ඇතුලේ ඉන්න මිනිසුන් කලන්තේ දාලා වැටිලා. එහෙම ඇතුලෙ ඉන්න අය පන තියෙනකම් බොහොම ආරක්ෂාව ඇතිව හිර ගෙදර තියාගෙන ඉන්න නිසා මේ ව්‍යාපාරය ජාත්‍යන්තරයට අරගෙන ගිහිල්ලා, එම ව්‍යාපාරය අඩපණ කරන්න අවස්ථාව දෙන්නෙ නැහැ. මේ කරුණු නිසා අහිංසක දරු පරපුරත්, අහිංසක ජාතියත් වෙනුවෙන් මම ජනාධිපතිතුමාට සහයෝගය දැක්වීමට යෝජනා කරනවා. සමහර අය මේකට විරුද්ධ වෙන්න පුළුවන්. හෙට වෙනකොට මට විනය පරීක්ෂණයක් වුනත් ඇතිවෙන්න පුළුවන්. මේක මගේ පෞද්ගලික අදහසක්.

ඒ වගේම අපේ බල ප්‍රදේශයේ පතිනායක මන්ත්‍රීතුමා දන්නවා ඇති හීන් ඇළ පිළිබඳව කතා කරනවානම්, අපේ ප්‍රදේශයේ බණ ශාලාවක් තියෙනවා. එම ඇළ එම ස්ථානයේදී අපිරිසිදු වෙනවා. සියළුම නල මාර්ග ඇළට යන්න තමයි සකස් කරල තියෙන්නේ. මේ සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු යවලා සොයා බලන්න. අපි එදා ඒ ඇලෙන් නැව විතරක් නෙවෙයි වතුර බිව්වා. අපවිත්‍ර වන දේ ගිං ගඟ දක්වා ම ගමන් කරනවා. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මේ ඇල මේ මොහොත වනවිට සංවර්ධනය වෙනවා. ඒ වගේම ඌරල ඇල, ඒ වතුර ටික දැක්කම අද අපට සතුටුයි. ඌරල පාලමින් ඉහළ ඒ නිවාස වලින් සියලු කුණු අපද්‍රව්‍ය විසි කරන්නේ ඒ ඇළට.මෙන්න මේ කටයුත්ත නැවැත්වීමට වැඩපිළිවෙළක් කරනවා නම් හොඳයි. ඇළ දෙපස දැන්වීම් පුවරුවක් හරි ගහලා කුණු දමන එක නවත්තන්න කටයුතු කරනවා නම්, ඒ ඇළ ආරක්ෂා කරගන්න පුළුවන්. එහෙම අපි වැඩ කරනවා නම්, අපි යමක් කරනවා කියලා නොපෙනුනත්, එකේ වැදගත්කමක් තියෙනවා.

ඒ වගේම මම කීප වතාවකදීම කතා කළා. ඌරල සහබන්දු වැඩිහිටි නිවාසයේ කුණුටික ගන්නෙ නැති එක පිළිබඳව. මේ වන විටත් ගන්න යන්නේ නැහැ. ඊයේ පෙරේදා ක්‍රියාත්මක වුණාද කියන එක මම දන්නෙ නැ.හැ කරුණාකරලා එතනට ගිහිල්ලා ඒ කුණු ටික දාගෙන එන්න කියලා ඔබතුමා උපදෙස් දෙන්න කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. එතන ඉන්නෙ අහිංසක වැඩිහිටියන් පිරිසක්. මොකද ප්‍රදේශයේ තියෙන වැඩිහිටි නිවාසයක් ආරක්ෂා කර ගැනීම, පිරිසිදුව තබා ගැනීම වෙනුවෙන් යම්කිසි මෙහෙවරක් ඉටු කිරීම සියලුදෙනාගේම වගකීම වෙනවා. ඒ නිසා ඒ කුණු ගෙනියන වාහනයේ යන උදවියට කියලා ඒ කටයුත්ත සිදුකරන්න. එහෙමනම් මම මීට වැඩිය අද දවසේ කාලය ගන්නෙ නැහැ. සියලු දෙනාටම සුභ සන්ධ්‍යාවක්, සුබ අනාගතයක් පතමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා**

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම කතා කරන්න බලාපොරොත්තුවෙන් හිටියේ දැන් මැතිවරණයත් කිට්ටුයි. අපි දැක්කා පහුගිය කාලේම නිද්‍රාශීලීව හිටපු අපේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු බොහොම ක්‍රියාශීලීව වැඩ කරන විදිහක්. ඒ වගේම සභාවේ දී අහන්න ලැබුනා සුරංගනා කතා ටිකක්. මේක හදනවා. මේක මෙහෙම වෙනවා. ඇත්තෙන්ම ජනතාව හැටියට අද ජනතාවත් එක්ක කතා කළොත්, ජනතාව කියාවි මොකක්ද සිද්ධ වෙන්නේ, මොකක්ද සිද්ධවෙලා තියෙන්නෙ කියලා. අද අපේ ගම්වල කුරුඳු ගොවියට කුරුඳු ටික විකුණගන්න විදිහක් නැහැ. ඔබතුමන්ලා දකින්න ඇති පහුගිය දවස්වල හැමතැනම මේ උද්ඝෝෂණ කරලා මේ ආණ්ඩුවට දන්වන්න හැදුවා. 2000, 2500 තිබුන කුරුඳු ටික අද රුපියල් දාහට බැහැලා. ඒ වගේම රුපියල් දෙදාහට තිබ්බ ගම්මිරිස් ටික රුපියල් 400ට, 300ට බැහැලා. රු. 120.00 ට තිබුණු තේ කිලෝ එක රුපියල් හැට හැත්තෑවට බැහැලා. ඉතිං හරි සුරංගනා කතා ටිකක් කියනවා. අපි ගම්පෙරළිය යටතේ මේ පාරවල් හදනවා. මේ කරන්නේ බොරුවක්. ඔබතුමන්ලාට මතක ඇති පහුගිය මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තියෙද්දි, විශේෂයෙන් අපේ හිටපු උප සභාපතිතුමා සාක්ෂි දරාවි. හැම ගමකටම සෑම ග්‍රාම සේවා වසමකටම රුපියල් ලක්ෂ 10 ගානේ වැඩ කරන්න දුන්නා. මේ අවුරුදු 4ට ඇවිල්ලා දැන් මේ සැරේ තමයි පලවෙනි පාරට ගම්වලට ඇවිල්ලා තියෙන්නෙ. ඒත් මැතිවරණය කිට්ටු නිසා. ඒ වගේම මම බය නැතුව පැහැදිලිවම කියනවා. මේ කරන සියලුම ව්‍යාපෘති එදා අපි කරන්න තිබුණු ව්‍යාපෘති නවත්වලා අවුරුදු හතරක පමාවකින් පසුව තමයි නැවත ඒ සියල්ල මේ සිද්ධ කරන්නේ. පාලම් දැමීම සිදුකරගෙන ගියා, ඒදවස්වල හදපු project ටික, ඇස්තමේන්තු ටික, ඒ දවස්වල හදපු ස්ථාන යොදාගෙන තමයි මේ අය මේ යෝජනා දාගෙන යන්නේ. ගරු සභාපතිතුමනි මේ ප්‍රාදේශීය සභාවට ගල් රෝලක්, මෝටර් ග්‍රේඩරයක් ලැබෙන්න තිබුණා. ඒ සියල්ල නතර කළා. ඒ සියල්ල නතර කරලා බවුසරයක් විතරක් දීලා තියෙනවා. අපි බවුසරයක් දුන්නා. ආදාහනාගාරයක් දෙනවා කියලා කියනවා. ආදාහනාගාරයේ කටයුතු සියල්ල සූදානම් වෙලා තිබුනෙ. මේ ආණ්ඩුව තමයි අදාහනාගාරය නතර කළේ. දැන් ඒ නතර කරපු ආදාහනාගාරය මේ අය දුන්න වගේ කතා කරනවා. මොකද මම ප්‍රාදේයශි සභාව ගැන බොහොම අවධානයෙන් හිටියා. මේ සිදුවන කටයුතු ගැන අවධානය යොමු කළා. මේ කරන්නේ සුරංගනා ලෝකයක් මවා පෙන්වීමක් කියන එක මේ අවස්ථාවේදී මතක් කර සිටිනවා. ගමේ මිනිහාට, ගොවීන්ට, දුප්පත් මිනිහට කුරුඳු ගම්මිරිස් ටික විකුණගන්න බැරිව පාරවල් කොන්ක්‍රීට් කරනවා. පාරවල් කොන්ක්‍රීට් කරන එක හොඳයි. ප්‍රධාන පාරවල් තියෙද්දි එක ගෙදරකට යන පාරවල් කොන්ක්‍රීට් කරනවා. සමෘද්ධිය දීපු හැටි අපි ගිය සභාවේ කතා කළා. වාහන තියෙන රජයේ රස්සාවල් කරන අයට තමයි සමෘද්ධිය ලැබිලා තියෙන්නේ. මේ වගේ සුරංගනා කතා වලට රටේ ජනතාව රවට්ටන්න බැහැ. අපේ ගම්වල අහිංසක මිනිස්සු රවට්ටන්න බැහැ. අනිවාර්යයෙන්ම ඉදිරි මැතිවරණයේදී ගෙදර යන්න සූදානම් වෙන්න කියන එකත් මතක් කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම ඇත්තටම අද සභාව ගැන සතුටු වෙනවා. මොකද මේ රටේ සිදු වන සංවර්ධනය ගැන. ඒ වගේම ගිය සභා වාරයේදී සමෘද්ධිය ගැන කතා කළා. වෙන කිසිම කටයුත්තක් කතා කරන්න වුනේ නැහැ. අද වන විට රට පුරා සිදුවන සංවර්ධනය, මේ සභාවේ පාලක පක්ෂයට දැනිලා තියෙන බව මේ කතාවලින් පේනවා. මට එක පැත්තකින් හිතෙනවා සභාපතිතුමා මේ කරගෙන යන මධ්‍යස්ථ වැඩපිළිවෙළ අඩාල කරන්න, සමහර වෙලාවට මේ සංවර්ධන කටයුතු සිදු වුනොත් සභාපතිතුමාට මේකෙන් ලකුණු වැටේ ද? මේ සභාවට ලකුණු වැටේ ද? එහෙම නැත්නම් මේ රජයට ලකුණු වැටේ ද? කියලා මේ සංවර්ධනයට බය වුණු පිරිසක් කතා කරන දේ තමයි මට දැනෙන්නේ. මොකද මීට කලින් ගිය සභා වාරයේදී අපේ සමන් මන්ත්‍රීතුමා කතා

කළා. මට මතකයි එක්සත් ජාතික පක්ෂය අල්ලගෙන මේකට මඩ ගහන්න යම් උත්සාහයක් කළා. අද වනවිට තවත් කොටසක් තමයි මම දැක්කේ. අපේ සභාපතිතුමා සමහර වෙලාවට මේ රජයේ ඉන්න මැති ඇමතිවරුත් එක්ක සහයෝගයෙන් කටයුතු කරලා, මේ සභාවේ අවශ්‍යතා ඉටු කරගන්න ඔබතුමා පුද්ගලිකව මැදිහත් වෙලා, යම් තරමක් දුරට ඒ කටයුතු කරගෙන යන වෙලාවක, ඒ ගැන යම් පිරිසකට කනගාටුවක් ඇති. මම දන්නේ නැහැ. මේ කරගෙන යන කටයුතු නැවැත්තුවම කාට හරි වාසියක් වෙනවද කියලා. නාගොඩ ප්‍රාදේශීය සභාවේ මහජනතාව වෙනුවෙන් ඔබතුමා සහ මේ ප්‍රාදේශීය සභාව කරන කටයුතු නවත්වන්න එක්තරා කණ්ඩායමක් කටයුතු කරන ආකාරයක් තමයි මට පේන්නේ. එකේදි මම දන්නේ නැහැ. ඔබතුමා සභාපතිතුමා විදිහට ඔබතුමාත්, නියෝජ්‍ය සභාපතිතුමාත් අනිත් මන්ත්‍රීවරු ඉදිරියේදී කොහොමද කටයුතු කරන්නෙ කියලා. ඇත්තෙන්ම මේ ඉතිහාසය දිහා බැලුවම ගොඩක් සංවර්ධන යෝජනා ගේනවා. අපේ විලේගේ සහෝදර මන්ත්‍රීතුමා මගේ කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීතුමා හොඳ කතාවක් කළා. එතුමා ඒ පාලම් ගැන කිව්වා. ඇත්තටම විලේගේ මන්ත්‍රීතුමනි, ඒ පාලම් දාන්න ඕන තැන තමයි කවුරුත් පාලම් දාන්න උත්සාහ කරන්නෙ. මොකද අපිට ඕන ඕන තැන්වල පාලම් දාලා හරියන්නේ නැහැ. මට මතකයි සුසන්ත මන්ත්‍රීතුමා එක්තරා සභා වාරයකදී මාමණ්ඩොල ඇළ හරහා යන උඩලමත්තේ පාලම ගැන කතා කළා. එතුමා කිව්වා ඒ සියලු කටයුතු ඉල්ලීම් කරේ එතුමා කියලා. අවුරුදු හතරකට එහා කාලයක් උත්සාහ කරපු එකේ ප්‍රතිඵල, ඒ කියන්නේ එතුමා අවුරුදු 20 ක කාලසීමාව ඇතුළත එතුමට ගන්න බැරි වෙච්ච දේ ගරු වජිර අබේවර්ධන ඇමතිතුමා එක රැයෙන් අපට ගෙනත් දුන්නා. මම හිතන්නේ 1991 වර්ෂයෙහි සිට මේ ප්‍රාදේශීය සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙක් විදියට ඒ තනතුරු දරපු මන්ත්‍රීවරයෙක් විදියට උත්සාහ කරපු දේ එතුමට බැරිවෙච්ච දේ අපේ මේ වර්තමාන පළාත් පාලන ඇමතිවරයා පත් වුණ වහාම එකට අනුමැතිය ලබා දුන්නා. ඒ වගේම තමයි උඩුගම ප්‍රදේශයේ තව පාලම් තුනක කටයුතු මේ වන විට සිදු කරගෙන යනවා. කෝටි තුනේ පාලම් හතරක්ම උඩුගම ප්‍රදේශයේම ඉදිවෙනවා. ඊට පස්සේ යටලමත්ත සහ වෙනත් ප්‍රදේශවල පාලම් හය හතක්ම ඉදි කරනවා. මේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ ලක්ෂ තුන්සීය පාලම් ඉදිකරනවා. මේ සංවර්ධන කටයුතු සිදු කරන්නේ මේ ඡන්දයක් හින්ද නෙවෙයි. විලේගේ මන්ත්‍රීතුමා කොට්ඨාස මන්ත්‍රීවරයා විදියට ඔබතුමා කතා කළා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලේ ග්‍රාම සේවා වසමකට ලක්ෂ දහයක ව්‍යාපෘති කරන විට, අපි මේ මොහොත වෙන විට ලක්ෂ 25 කටත් එහා පළවෙනි අවුරුද්දෙම වැඩ කටයුතු කළා. දින සීයේ ඇතුලත වැඩ කළා. ඒ සියලු කටයුතු ඔබතුමාලට පාලක පක්ෂ විදියට මතක නැද්ද කියලා මම දන්නෙ නැහැ. අපේ ප්‍රියන්තා මන්ත්‍රීතුමිය මගෙන් දවසක් ඇහුවා. අපේ කොට්ඨාශයේ එහෙම එකක් වෙලා නැහැයි කියලා. නමුත් ඇත්තටම බලනකොට හැම වසමකටම ප්‍රාදේශීය සභාවේ ග්‍රාම සේවා වසම් 53ටම සමහර වෙලාවට ලක්ෂ නෙවෙයි කෝටි ගණන් වලින් ව්‍යාපෘති මේ වන විට සිදුකරගෙන යනවා. ඒකෙදි පක්ෂයක් ප්‍රදේශයක් පාටක් බලන්නේ නැහැ. අවශ්‍යතාවය මත සෑම කොට්ඨාසයකම, සෑම ග්‍රාම සේවා වසමකම සාර්ථක විදියට මේ ගම්පෙරළිය යටතේ සහ තවත් සාර්ථක ව්‍යාපෘති කරලා ඒ කටයුතු සිද්ධ වෙන මොහොතක, ඇත්තෙන්ම මම හිතන්නේ ඔබතුමාල තමයි අද වෙනකොට අවදි වෙලා තියෙන්නේ. අපි නෙවෙයි. ඔබතුමා කියනවා එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයෝ අවදි වෙලයි කියලා. ඔබතුමාලා තමයි අවදි වෙලා තියෙන්නෙ.

ඒවගේම සමෘද්ධිය දෙනකොට ඇත්තටම පුද්ගලිකව ස්තූති කළා. ඒක අපට දැනුනා. මම දයාගමගේ ඇමතිතුමාට පුද්ගලිකවම ස්තූති කළා. මොකද ඔබතුමා කරන කටයුත්ත හොඳයි කියලා. මොකද මෙච්චර කල් බලය අපට නොදීපු එකේ වැරැද්දක් තිබුණා. සමහර අපේ ඇමතිවරු දැනටත් අපේ සභාපතිවරුන්ට සහ වජ් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඕන විදියට වැඩ කරන අවස්ථා තියෙනවා. නමුත් ඒක අද ක්‍රමක්‍රමයෙන් එතුමන්ලා සාර්ථක විදිහට කරනකොට, යම් කණ්ඩායම් වලට මේක දරාගන්න බැරි තත්ත්වයක් උදාවෙලා තියෙනවා. අපේ ගරු සභාපතිතුමා කොළඹ පළාත් පාලන පුහුණුවකට සහභාගි වූ අවස්ථාවේ වජිර අබේවර්ධන මැතිතුමා එතනට ඇවිල්ලා ප්‍රකාශයක් කළා. පසුගාමී

ප්‍රාදේශීය සභාවක් විදිහට තවලම ප්‍රාදේශීය සභාවට එතුමා ලක්ෂ 200ක මුදලක් පහුගිය සතිය වෙනකොට එව්වා කියලා. නමුත් අපට මේ අවස්ථාවන් ගන්න තියෙනවා. ප්‍රදේශයේ මහජනතාවට ගන්න තියෙන අවස්ථාවන්, අපි විපක්ෂය විදිහට කඩාකප්පල් කරන්න නැතුව සාර්ථකව මේවට ඔබතුමාට සහයෝගය දෙන කොට, ඔබතුමාගේ කණ්ඩායම විසින්ම කකුලෙන් අදින එක ගැන කණගාටු වෙනවා. මොකද මේ ප්‍රාදේශීය සභාවට අපි ආවෙ පුද්ගලිකව. මහින්ද රාජපක්ෂගෙවත්, රනිල් වික්‍රමසිංහගෙවත් න්‍යායපත්‍රය සිදු කරන්න නෙවෙයි. මහජනතාව ඡන්දය දුන්නේ අපි දිනල හරි, පැරදිලා හරි, මොන කණ්ඩායමක් විදිහට හරි, ප්‍රාදේශීය සභාවට ආවෙ, අපි මැතිවරණයකට ඉදිරිපත් වුණේ, මේ ප්‍රදේශයේ මහජනතාවගේ ගැටළු විසඳන්න. ඒක කරගෙන යනකොට ඒක බලාගෙන ඉන්න බැරි නම් ඒ ගැන මට විශාල කනගාටුවක් ඇතිවෙනවා. ඔබතුමාලගේ දැනුමේ හැටියට පුද්ගලිකව මොකක්ද වෙන්නෙ වෙන්නෙ කියලා හිතාගන්න. ඒ ගැන මීට වඩා කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ පාලක පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් කටයුතු කරන ආකාරය ගැන ඉතාමත් කණගාටු වෙනවා. ඔබතුමා මම දන්නේ නැහැ එතනදි මොන ආකාරයෙන් ක්‍රියා කරයිද කියලා. අපි ඔබතුමාගෙන් ඉල්ලලා තියෙන්නේ සමහර වෙලාවට අපට ලයිට් එකක් දාලා දෙන්න කියලා විතරයි. නමුත් මේ කෝටි ප්‍රකෝටි ගණන් වැඩසටහන් මේ රජය හරහා මේ ප්‍රාදේශීය සභාවට ගේන්න විශේෂයෙන්ම අපේ මේ විපක්ෂ කණ්ඩායම සභාව විදියට අපි හත්දෙනා සහ අපේ අනිකුත් පක්ෂවල මන්ත්‍රීවරුන් සියලු දෙනා එකතුවෙලා මේවා සාධාරණයක් කරන්න මේවටත් පොදුවේ කටයුතු කරන්න කියලා ඉල්ලීම් කරනවා. ඒ කටයුතු ඒ ආකාරයෙන් කරනකොට මේ වගේ බාධාකිරීම් එන එක ගැන, දේශපාන වශයෙන් ගැටලුවක් තියෙනවා. ඉතින් ඔබතුමාගේ දේශපාලනය තමයි ඒ කියලා තමයි මහජනතාව හිතන්එනෙ. ඇත්තෙන්ම දැන් සෑම ග්‍රාම සේවා වසමකම ලක්ෂ 10, 15, 20, 25 සංවර්ධන කටයුතු දිගින් දිගටම ක්‍රියාත්මක වෙනවා.

ගරු සභාපතිතුමනි විදුලිය සැදීම ගැන කතා කරනවනම්, පසුගිය කාලයේ ඔබතුමා යම්තාක් දුරකට ඒ කටයුත්තට මැදිහත් වෙලා ඉතාමත්ම උවමනාවෙන් සෑම වසමකටම ගිහිල්ලා, විශේෂයෙන්ම හඟරංවල වගේ දුෂ්කර පළාත්වලට ගිහිල්ලා කටයුතු කර තිබුණා. ඒ ගැන විශේෂයෙන්ම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම අලුතින් ගත්ත රියදුරු සහ ඒ අය කාර්යය ක්‍රමානුකූලව කරන බවත් පේනවා. ඉතින් ඇත්තෙන්ම පුද්ගලික අපේ ඉල්ලීම් නොවුනත්, කොයි ආකාරයෙන් හරි ඔබතුමා ප්‍රධාන පාරවල් සහ අතුරු පාරවල්වල වීථි ලාම්පු පිළිබඳ සොයා බලා කටයුතු කරන විදියට අපගේ ස්තූතිය පුද කරනවා.

ඒ වගේම තමයි හැමදාම කතා කරන වටවල වතු සමාගමෙන් අපේ ප්‍රදේශයටත් විශාල පරිසර හානියක් කරනවා. ධර්මසිරි මන්ත්‍රීතුමා සභාවකදී ඒ ගැන කතා කළා. හැටන් ප්‍රදේශයේ ඉඳලා මේ ප්‍රදේශයට ගොම ලොරි ගණන් ගෙනත් දානවා. එහේ හෙක්ටයාර ගානක වතු තිබුණට එහෙම අපද්‍රව්‍ය දාන්න දෙන්නෙ නැහැ. ඒ ප්‍රදේශවල තියෙන නීති රීති වැඩියි. නමුත් මේ ප්‍රදේශයේ අපි ඒ ගැන හොයන්නේ බලන්නේ නැති නිසා, පරිසරය ගැන අවධියෙන් නොසිටින නිසා, හැටන් ප්‍රදේශයේ ඉඳලා විශාල මුදලක් වියදම් කරලා අපේ බල ප්‍රදේශයේ විශේෂයෙන්ම කාබිල්වත්තෙ ඉඳලා නාකියාදෙණිය වෙනකම් මග දෙපස ගෙනත් බානවා. ගොම ලොරියක් ගියාට පස්සේ ඒක පස්සේ යන්න බැහැ. ගිය සෙනසුරාදා මම මගේ දුව පංතියට දාන්න යනකොට උඩුගම දකුණ ඉස්පිරිතාලේ පොඩ්ඩක් එහායින් පාර දිගේ ලොකු ගඳක් එනවා. මොකද පාර ඉස්සරහින් ගොම ලොරියක් ගිහිල්ලා. හැමතැනම ගොම ඉහිරිලා. නාකියාදෙණිය ට යනකම් ගඳයි. අලුත්වත්තෙන් ඇතුලට ගිහිල්ලා තියෙන්නේ. පරිසරය ගැන අපේ නීති රීති නැති නිසා මේ දේවල් සිදු වෙනවා. ගරු සභාපතිතුමනි ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා විදියට ඔබතුමාට තියෙන බලතල පාවිච්චි කරලා ඒ කටයුත්ත වහාම නතර කරන්න ක්‍රියාකරන්න කියලා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මොකද ඒක විශාල සෞඛ්‍ය ප්‍රශ්නයක්. වර්ෂාව කාලෙට කඳු මුදුන්වල දාන ගොම දියවෙලා ඇවිල්ල අපේ ළිංවලට, ජලාශවලට එකතුවෙන්න

පුලුවන්. ඒ නිසා අදාල නිලධාරීන් දැනුවත් කරලා නීත්‍යානුකූලව කටයුතු කරන්න ඔබතුමාගේ බලය පාවිච්චි කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි උඩුගම පොල ගැන ඔබතුමා කතා කළා. උඩුගම පොළ සංවර්ධනය පිළිබඳ මම සතුටු වෙනවා. නමුත් අපි බලාපොරොත්තු වන සංවර්ධනය එතන වෙන්නේ නැහැ. මොකද මේ සභාවෙන් ලක්ෂ තුනහමාරක මුදලක් ඇස්තමේන්තු කරලා, මම දන්නේ නැහැ කාගේ උවමනාවක් ද මේ ඉටු කරන්නේ කියලා. තාක්ෂණ නිලධාරී මහත්වරුන්ට නෝනලට ඕන විදිහට මේවා කරනවද? සභාපතිවරයා හරි මන්ත්‍රීවරු හරි මහජනතාව ඉල්ලන දේවල් කරනවද කියලා තමයි අපට දැනගන්න ඕන. සභාවේ පොල විදිහට අලුතෙන් ගොඩනගලා තවම විවෘත නොකරපු පොළක් පැත්තට ගිහිල්ල ලක්ෂ ගණන් වලින් පයිප්ප දානවනම්, අර පොළට බහින තැන මඩ වෙන එක ගැන කතා මම ගිය සභාවේදි කතා කලා. කොරි පස් ටිකක් දාලා රුපියල් පනස් දාහක් වියදම් කළා නම්, ඔය ලක්ෂ ගනන් යන්නේ නැහැ. ඔය ගැටලුව විසඳන්න පුළුවන් නමුත් ඒ ගැන ඔබතුමා සභාවේදි අන්තිමට කියයි ලේඛන පෙන්නලා අපි මෙච්චර මුදලක් උඩුගම පොළ සංවර්ධනයට යොදවලා තියෙනවා කියලා. නමුත් ඒ මිනිස්සු වෙනුවෙන් ඒ ප්‍රදේශයේ ජනතාව සහ මේ පොළේ පාරිභෝගිකයා බලාපොරොත්තු වන සේවය නම් ඉෂ්ඨ වෙන්නේ නැහැ. ඒ මුදල් යහපත් විදිහට මහජනතාවගේ අවශ්‍යතාවයට අනුකූල ආකාරයට වියදම් කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒක අපේ යුතුකමක් වගේම වගකීමක්.

ඒ වගේම අවසාන වශයෙන් කියන්න ඕන. අපේ ප්‍රාදේශීය සභාවේ ගල්ලන්දල ඉඳලා කටඹුරාව දක්වා අපට අයිති ප්‍රදේශය හරහා I ROAD යටතේ මාර්ගයක් ඉදිවෙමින් පවතිනවා. ගාල්ල උඩුගම පහුගිය කාලේ ඔබතුමාලා හදපු මාර්ගය වගේම මාර්ගයක්. හිනිදුම පල්ලිය අසල සිට ලබුදූව දක්වා කිලෝමීටර් 50 කටත් අධික මාර්ගය ඉතාමත් විශාල වියදමක් කරලා සංවර්ධනය කරන්න දැන් ආරම්භ කරල තියෙනවා. ඒව සුරංගනා කතා නෙවෙයි. ඔබතුමාලට සුරංගනා කතා විදියට දකින්න පුළුවන්. නමුත් අද වන විට වැඩ ආරම්භ කරලා තියෙනවා. ඌරල ප්‍රදේශයේ අවශ්‍ය යාඩ් එක ඉදිකරලා තියෙනවා. දැන් මැනුම් කටයුතු කරගෙන යනවා. ඉතින් හිනිදුම ඉඳලා ලබුදූව දක්වා ඒ මාර්ගයත් හැදුනට පස්සේ, මම හිතන්නේ අපේ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන මාර්ග සියල්ල වගේ 80%ක් 90% ක් ප්‍රධාන මාර්ගය අංග සම්පූර්ණයි. ඒ වගේම අපේ සහබන්දු මහත්මයා කිව්ව වගේ ඔබතුමා උද්ඝෝෂණය ගියපු මාමණදොළ මාර්ගයට කිලෝමීටර් දෙකක් විතර, ලක්ෂ 260 ක වගේ මුදලක් වෙන් කරලා තියෙනවා. කුඹුරුහේනට, තල්ගස්වල වත්තට, යටලමත්තට, බෙම්බඩට සියලුම ප්‍රදේශවලට විශාල ලෙස මුදල් වෙන් කරලා තියෙනවා. නමුත් ඉතිහාසෙ අපි එහෙම දැකලා නැහැ. මොකද 2011 ඉඳලා මේ ප්‍රාදේශීය සභාවෙ ඉන්නවා. 1978 ඉඳලා මේ ප්‍රදේශයේ ජීවත් වෙනවා. නමුත් අද වන විට කරන සංවර්ධනය කිසිම රජයකින් කරපු නැති සංවර්ධනයකට දැවැන්ත සංවර්ධනයකට අත ගහලා තියෙනවා. අතගහලා, අතහැරලා නෙවෙයි. ඒ සියලු කටයුතු කරගෙන යනවා. ඉතින් ඒ සඳහා කුහක නොවී ඔබතුමාලගේ සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. සහයෝගය ලබා දුන්නත්, නොදුන්නත් ඒ වැඩ ඒ ආකාරයෙන්ම කරනවා. ඉදිරි මැතිවරණය ජයග්‍රහණය ගැන අපි බලාගන්නම් කියලා ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. උපසභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, කතානොකර ඉන්න හිතුවත්, තරංග මන්ත්‍රීතුමා කියපු දේට උත්තරයක් දෙන්න ඕන. මොකද මම ගිය සභාවාරයේ මතක් කලේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් දීපු සමෘද්ධිය පිළිබඳව. නමුත් ගරු සභාපතිතුමනි කිසිසේත්ම ගමේ පොදු කටයුත්තක්, හොඳ දෙයක් කරනවා නම්, එය එක්සත් ජාතික පක්ෂයෙන්ද, ජනතා විමුක්ති පෙරමුණෙන්ද, ශ්‍රී ලංකා එකෙන් ද කියන එක ප්‍රශ්නයක් නැහැ. හොඳ දෙයක් කරනවා නම් අපි එතන ඉන්නවා. හොඳ දෙයක් අපි නිහතමානීව

පිළිගන්න ඕන. ඒක නිසා අපි බලාගෙන ඉන්නේ ඔය මුල්ගල් තියපුවා සාර්ථක වේද? නොවේද? කියලා. ඒක එක්සත් ජාතික පක්ෂයේ වැඩක්. මිනිසුන්ගේ බලය කාටද තියෙන්නෙ කියලා, ඉදිරි මැතිවරණයේදී තීරණය වේවි. මම මෙතන දේශපාලනය කතා කරන්න යන්නේ නැහැ. සමෘද්ධිය දීපු එක විතරයි කියන්නේ. එතනදී එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයන්ට තමයි තෝරලා දුන්නේ කියලා මම දැනටත් කියනවා. එතනදී ගිය ආණ්ඩුවේ වැරදි ඇති. නමුත් ගිය ආණ්ඩුවෙන් වැරදි කළා කියලා මේ ආණ්ඩුව එක කරන්න ඕන නැහැ. තරංග මන්ත්‍රීතුමා කිව්වා එක්සත් ජාතික පක්ෂයට එක එල්ලේම ඇඟිල්ල දික්කලා කියලා. ඉතින් ඒක නිසා මම කියන්නේ හොඳ දෙයක් නම් අපි ඒක හොඳ විදියට දකිනවා. ගරු සභාපතිතුමනි, මුල්ගල් කියපුවා ගැන මම මීට පෙරත් කතා කළා. ඔබතුමාලගේ ආණ්ඩුවෙන් කරන්න පුළුවන් දෙයක් තියනවනම් කරන්න. ඊට පස්සේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පත්වෙන ආණ්ඩුවේ දී අපි ඉතුරු ටික කරන්න බලාපොරොත්තු වෙනවා. ඒක නිසා මම වැඩිදුර කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. බොහොම ස්තූතියි ගරු සභාපතිතුමනි, මම එක්සත් ජාතික පක්ෂයට එම අවස්ථාවේදී චෝදනා කළේ නැහැ. හරි දෙයක් කරනවා නම් අපි කඩාකප්පල් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඔබතුමාට පුළුවන් දෙයක් තියෙනවා නම් ඔබතුමාලා කරන්න අපි සහයෝගය දෙන්න පුළුවන් දෙයක් තියෙනවා නම් අපි සහයෝගය දෙන බවත් මතක් කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි. ගරු මන්ත්‍රී එහෙම ගොඩ මහත්මා පියල් කිරිමද ගොඩ මහත්මා

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අපේ සහබන්දු මැතිතුමාගෙන් මට අහන්න ප්‍රශ්නයක් තියෙනවා. ඔබතුමා ගිය සභාවේදි ප්‍රකාශ කරලා තිබුණා. සමෘද්ධි සහනාධාරය 14 වෙනිදා දෙනවා කියලා. මේ වාර්තාවෙ තියෙනවා. කොහෙද දීලා තියෙන්නේ. මොකද හැමෝම හිතාගෙන ඉන්නේ සමෘද්ධි සහනාධාරය දීලයි කියලා. එහෙම දෙයක් සිද්ධ වෙලා නැහැ. මොකද මේවා මගදී සංශෝධනය වෙනවද දන්නෙ නැහැ. වසම් දහතුනේ ම දීලා නැහැ. සමෘද්ධි කලාපයේම දීලා නැහැ. අතරමගදී දේශපාලන වශයෙන් සංශෝධනයක් වෙන්නේ නැහැ නේද? ඔබතුමා දන්නෙ නැති වුනාට මම දන්න ඒව මම කියන්නේ. මම ගිය සැරේ බෝධිසත්ව ගුණය ගෙනත් ඔප්පු කරානෙ. නිලධාරී තුන් දෙනෙක් තමයි සමෘද්ධි සහනාධාර හදන්නේ. ආර්ථික සංවර්ධන නිලධාරි, සමෘද්ධි සංවර්ධන නිලධාරි, සහ ග්‍රාම නිලධාරී. නමුත් ඒ ලේඛනයේ මුල්පිටපත නැතුව වෙන ලේඛනයක් එන බව ඔබතුමා දන්නවද? එහෙම එනවා මම ඔප්පු කරලා පෙන්වනවා. ඒ කාලේ වෙච්ච දේවල් මම පිළිගන්නවා. ඒක වැඩක් නැහැ. මම අහන්නේ මේ දැන් වෙන සිද්ධි ගැන.

ඒ වගේම වසන්ත කුමාරගේ මහත්මයගෙන් අහන්න ඕන. ගිය අවුරුද්දේ වැසිකිළි පද්ධතියක් හදන එක නවත්තනකොට එදා ඔබතුමාලා කතා කලේවත් නැහැ. මම ඒ කොටසෙ මන්ත්‍රීවරයා. ඒක නවත්තන්න සභාපතිතුමාට යම් යම් බලපෑම් ආවා. සභාපතිතුමා නැවැත්තුවෙ නැහැ. එතකොට මම අහන්නේ වසන්ත කුමාරගේ මහත්මයාලා හිටියේ කොහේද කියලා. දැන් කෙලින්ම කතා කරනවා. ගිය අවුරුද්දේ වුණ දේ මම මේ අහන්නේ. ඒ වගේම තමයි වසන්ත කුමාරගේ මහත්මයා කිව්වා මාපලගම මහජන ක්‍රීඩාංගණය සුද්ද කෙරුවයි කියලා. ඒ ගල් මුල් තියෙන්නේ අයිනකට වෙන්න. මම කියන්නේ එහෙම නෙවෙයි මැද තිබිච්ච සේරම අයින් කරල ගේට්ටුවට ඉබ්බො දාලා දැන් ආරක්ෂාකාරි විදිහට තියෙනවා. මම ඒ දේ වෙනුවෙන් සභාවට ස්තූතිවන්ත වෙනවා. අපේ සභාවෙ කම්කරුවන් ගිහිල්ලා, සුද්ද කරලා, පිට්ටනියට ආරක්ෂාකාරී පියවරක් අනුගමනය කරලා තියෙනවා. දැන් වෙනම ගේට්ටුවකින් විතරයි යන්න තියෙන්නෙ. මම මීට වඩා කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමියගෙන් අවසරයි. පසුගිය විසිපස්වැනිදා ගාල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අපේ කාන්තා රැස්වීමක් තිබුණා. ඇත්තටම එතනදි අපේ සභාව අරගෙන බැලූවහම, අපිට එක එක සභාවන්වල කාන්තාවන් කතා කරන හැටි බැලුවම පුදුම හිතුණා. එතැනදී අපට සාකච්ඡාව තිබුණේ දේශපාලන මතිමතාන්තර තිබුනත්, අපේ සභාව දියුණු කරගන්න ආකාරය තමයි කිව්වේ. දේශපාලනික වශයෙන් මොන පැත්තෙන් හරි සභාවට ආදායම් මාර්ග දියුණු කරගන්න කිව්වා. මොකද සමහර සභාවන්වල ඒ සහෝදරියො කිව්වා. ඉන්ධන දීමනාවවත්, දුරකථන දීමනාවවත් දෙන්න විදියක් නැහැ කියලා. එයාලට දෙන්නෙ ප්‍රතිපූර්ණය කරන මුදල විතරයිලු. සභාවේ ආදායම වැඩි වන විට ඉන්ධන දීමනා, දුරකථන දීමනා ඒ වගේ දේවල් වැඩිකරගන්න පුලුවන් වෙනවා කිව්වා. සමහර සභාවන් බොහොම අමාරුවෙන් තමයි කටයුතු කරන්නේ. කාන්තා පාර්ශවය කියන ප්‍රශ්න දිහා බැලුවම අපට මේ සභාපති තුමා ඉන්න නිසා කිසි ප්‍රශ්නයක් නැතුව, අපේ සභාව ගෙනියනවා කියලා හිතෙනවා. ඒ ගැන මම ස්තූතිවන්ත වෙනවා. මොකද අපි මොන පක්ෂයේ වුනත්, මේ ගම සංවර්ධනය වෙනවා නම් ඇත්තටම අපි සතුටුයි. අපි පාර්ශව තුන හතරක්ම තිබුණද, ගමට සංවර්ධනය වෙනකොට අපි විරුද්ධ වන්නේ නැහැ. යටලමත්තට අපි මන්ත්‍රීවරු තුන් දෙනෙක් ඉන්නවා. විජිත් මහත්මයා, ඒ වගේම නන්දන මන්ත්‍රීතුමාත්, මමත් ඉන්නවා. නමුත් ඇත්තටම අපට ඡන්දෙ දුන්නැයි නොදුන්නැයි කියලා මම මිනිස්සුන්ගෙන් ප්‍රශ්න කරන්න යන්නේ නැහැ. මිනිසුන්ගේ ප්‍රශ්න අපට කියනවා. මොකද මෙතනට පත්වුණා නම්, දීමනාවක් ගන්නවා නම්, එක එක ප්‍රශ්නවලට විරෝධතා දක්වන එක නෙවෙයි. අපිට ඕන ජනතාවට කොහොමහරි යමක් කරන තැනට වැඩ කටයුතු කරන්න. ගමට සංවර්ධනය එනකොට අපි කැමැත්තෙන් අපි වැඩ ටික කරගන්නවා. නැත්නම් සභාවෙන් දැරිය යුතු දේවල් තමයි අපි කොහොම හරි මොන විදියෙන් හරි කරන්නේ. එතකොට අපේ සභාපතිතුමාට සතුටු වෙන්න පුළුවන්. අසවල් ගම් ටික සංවර්ධනය වෙනවා කියලා. නැත්නම් අපේ සභාවෙන් ඒ සංවර්ධනය කරන පාරවල් ටික සංවර්ධනය කරන්න ගියා නම්, අවුරුදු පහක් නෙවෙයි අවුරුදු විස්සක් ගියත් ඒ දේ කරගන්න බැරි වෙනවා. ඒ නිසා අපි එක එක්කෙනාට ඇඟිල්ල දික් කරගන්නෙ නැතුව, අපි සභාවක් හැටියට දේශපාලන මතිමතාන්තර ඡන්දෙ කාලෙට විතරක් තියලා, මේ සභාවට ආවට පස්සේ ඒ මතිමතාන්තර අයින්කරගෙන, සභාවේ දියුනුවට වැඩ කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ඊයේ මලගමක් තිබුණා. සභාපතිතුමා ගිහිල්ලා එවෙලෙම ඩෝසරේ ගෙන්නලා පාර කැපුවේ කාගෙන්වත් අවසර අරගෙන නෙවෙයි. ඒ අවස්ථාව අනුව සභාපතිතුමා වැඩ කරනවා. ඒක නිසා මම හිතන්නේ තව දුරටත් අපේ මේ විසි හත් දෙනා එක එක තර්ක දාගන්නේ නැතුව මේ සංවර්ධන යෝජනා ගෙනාවම බොහොම කැමැත්තෙන් භාරගෙන වැඩකටයුතු කරගැනීමට අපි අවස්ථාව ලබාදෙමු. අපි දේශපාලන කාලයේදී දේශපාලන වැඩ කරමු. මෙතනට ආපුවම අපි විසි හත් දෙනාම එකයි. සංවර්ධනය සිදුකළොත් ඒක අපි විසිහත් දෙනාටම හොඳයි. මම අයවැයට විරුද්ධ වුණේ මොකද කියල කියන්නම්. මමත් සභාපතිතුමාට ඉල්ලීම් පහක් ද කොහෙද යෝජනා ලබාදී තිබුණා. නමුත් ගිය සැරේ එකක්වත් කරේ නැහැ. ඒක නිසා මටත් අයවැයට විරුද්ධ වෙන්න අයිතියක් තියෙනවා. ඒක නිසා එහෙම දේශපාලන ප්‍රශ්නයක් නෙවෙයි. ඒවගේම අද ආදාහනාගාරය සම්බන්ධව යෝජනා කවුරු විරුද්ධ වුනත්, මම හිතන්නේ ගමට වැඩක් කරනකොට විලේගේ මන්ත්‍රීතුමා මේකට අකමැති නැහැ. ඒක නිසා අපි ඒක කරගමු. ඒ වගේම අපට ආදායමක් ලබාගන්න පුළුවන්. සියලු දෙනාටම සුභ සන්ධ්‍යාවක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රීනි ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාගෙන් අවසරයි. ඇත්තටම ප්‍රදේශයක් හැටියට හෝ කොට්ඨාසයක් හැටියට ගත්තහම, අපේ තරංග මන්ත්‍රීතුමා කිව්වා වගේ ගම දියුණු වෙනකොට, ගම සංවර්ධනය වෙනකොට බොහෝ වෙලාවට අපි සතුටු වෙනවා. ඒ වුනාට මන්ත්‍රීතුමා කොතනක හරි පුංචි වැරදීම් තියන තැන් තියෙනවා. සංවර්ධන ක්‍රියාදාමය තුල කොතනක හරි පුංචි වැරද්දක් තියෙනවනම්, ඒක ගොඩක් දුරට බලපානවා කියලා මම දකිනවා. නාගොඩ වත්තෙ අපේ ගෙදර ළඟ තියෙන මාර්ගය මේ වෙනකොට මීටර් 100 ක් විතර කොන්ක්‍රීට් යොදා සකස් කරලා තියෙනවා. හැබැයි මේ කොන්ක්‍රීට් කරලා තියෙන්නේ මාර්ගයේ මැද කොටසක්. මාර්ගයේ මුලත්, අගත් කොන්ක්‍රීට් කරලා නැහැ. නමුත් එතැන ගම්පෙරළිය මගින් සිදු කලා කියලා බෝඩ් එකක් ගහලා තියෙනවා. ඒ වුණාට ඒක නිකම් ලැජ්ජ සහගත දෙයක් වගේ පේනවා. මොකද ගමේ පෙරළියක් කරනවා නම්, ඒක පාරේ මුල සිට වත් අඩුගානේ අග දක්වාවත් ඒ කටයුත්ත කළා නම් තමයි ගම්පෙරළිය වෙන්නේ. ඒ නිසා ඒ පිළිබඳව මම හදවතින්ම කණගාටු වෙනවා. සංවර්ධනය කොහේ හරි වැරදිච්ච තැනක් ඇති. අවුරුදු විස්සක් තිබෙද්දී අපිට කරන්න පුලුවන්කම තිබුන නම්, අපිත් කරනවා. ඔබතුමාලට කෝටි ගානක්, ලක්ෂ ගානක් වියදම් කරලා කරන්න පුලුවන් දේවල්, කරේ නැති නිසා, මම ඒ ටික කොහොමහරි කරන්න උත්සාහ ගන්නවා. දැනුත් කරන්න බැරි කාලයක් තියෙන්නේ.

ඊළඟට සමෘද්ධි වැඩසටහන ගැන කතා කරද්දි, ඒ ගැන මම බොහෝ කණගාටු වෙනවා. මොකද සමෘද්ධිය දීපු අය ගැන අපි සාමාන්‍යයෙන් විවේචනාත්මකව ලක් කිරීමක් කරන්නේ නැහැ. ඒ වුනාට සමෘද්ධිය දිය යුතු ස්ථානවලටත් ලැබිලා නැහැ. මේක කාටවත් කියලා වැඩක් වෙන්නේ නැහැ. සමහර තැන්වල දුර්වල තැන් තියෙන නිසා මේකට අපි කොට්ඨාස මන්ත්‍රීවරයා හැටියට අපට කරන්න පුළුවන් දෙයක් තියෙනවනම්, ජනතාව වෙනුවෙන් ඒ දේ ඉෂ්ට සිද්ධ කරන්න ඕන. මගේ කොට්ඨාසයේ කිහිප දෙනෙකුට මේ වගේ අසාධාරණ තත්ත්වයක් සිදු වෙච්ච නිසා ඒ ගෙදරට ගිහින් ෆොටෝ එකක් හරි අරගෙන, ප්‍රාදේශීය ලේකම්තුමිය ළඟට ගෙනිහිල්ලා මෙන්න මේ ගෙදර තත්වය ඇයි මේ නිවසට සමෘද්ධි සහනාධාරය ලැබුනෙ නැත්තෙ කියලා ප්‍රශ්න කරනවා. ඇයි මන්ත්‍රීතුමා පලවෙනි අදියර යටතේ ඒ අහිංසක ජනතාව අහු වුනේ නැත්තෙ. ඒ වගේම අභියාචනා දාන්න කවුරුහරි දැනගෙන ඇයි අලුතෙන් හදනකොට මේ ජනතාව කවුද කියල හොයාගන්න බැරි වුනේ. අන්න එතන තමයි ඇති වෙච්ච වැරැද්ද. අපි කොහොමහරි ඒ කරුණු කාරණා ඉදිරිපත් කරමින් ඒ අයට සිදු වෙච්ච අසාධාරණය පිළිබඳව කුමන හෝ ක්‍රමවේදයක් මත ඒ කටයුත්ත සිද්ධ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඇත්තටම දේශපාලනයෙන් තොරව තමයි අහිංසක ජනතාවක් වෙනුවෙන් අපි කතා කරන්නේ. වසර ගණනාවකට පසුව තමයි අලුතින් මේ නවක සමෘද්ධි සහනාධාරය ලබාදීමේ කටයුතු සිද්ධ කළේ. එතකොට ඒ කාලය තුළ අහු වුණේ නැහැ. ඒ නිසා මම හිතන්නෙ ඒ වැරදිච්ච තැන් ටික හදාගන්න කියලා මම ඉල්ලීම් කරනවා. ඔය සංවර්ධන කටයුතු කිරීම තුළ අභියාචනා දාන්න කියලා මම ඉල්ලීමක් කළා. නැවත වතාවක් මම බලනවා විශේෂයෙන්ම ලැයින් කාමර තුල ජීවත් වෙච්ච කෙනෙක්, ඒ වගේම වැසිකිලිය පවා නැති අය ඉන්නවා. මම එක ස්ථානයකට වගේ නම් අධීක්ෂණයට එච්චා. ඉතින් ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරමින්, එම කටයුතු සඳහා සක්‍රිය දායකත්වය ලබා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීමක් කරමින්, විශේෂයෙන්ම සංවර්ධන කටයුතුවලදී ඒ සංවර්ධන කටයුතු සිදු කළාට වැඩක් නැහැ. ඒකට කාලෝචිතව සංවර්ධන කටයුත්තට දායකත්වයක් දෙන්න. සියලු දෙනාට සුභ දවසක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. තෙරුවන් සරණයි.

**ගරු උප සභාපතිතුමා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, සියළු දෙනාගෙන් අවසරයි. අපේ තරංග මන්ත්‍රීතුමා වැදගත් කාරණාවක් මේ සභාව හමුවේ තැබුවා. වටවල වැව්ලි සමාගමට අයත් නාකියාදෙණිය වතුයායේ ස්ථාන කිහිපයක්ම අපි දැක්කා මේ ගොම ලොරි ගෙනැල්ල කාබිල් එක පැත්තෙන් රබර් කැල්ලක බාලා තියෙනවා. ඒ වගේම උඩලමත්ත කොටසේත් යම් යම් ස්ථානවල මේ අපද්‍රව්‍ය බාලා තියෙනවා. මේක ඉතාම පරිසරයට අහිතකර දෙයක්. ඒ වගේම වෙනත් දිස්ත්‍රික්කයකින් තවත් දිස්ත්‍රික්කයකට සතෙක් ප්‍රවාහනය කලත්, බලපත්‍රයක් ලබාගත යුතුයි කියලා රටේ නීතියක් තියෙනවා. මේ අපද්‍රව්‍ය ගෙනත් දානවා කියලා ජනතාව විශාල වශයෙන් අපව දැනුවත් කරලා තියෙන්නේ. මේ වසංගතය වදුරටත් මේ වතුයාය ආශ්‍රිතව සිදු වුණොත්, විශාල පරිසර හානියකට ලක්වෙනවා. ඒවගේම ජනතාවගේ ජීවිතවලට, සොබ්‍යයට විශාල වශයෙන් හානිකර තත්ත්වයක් ඇතිවනවා. ඒ නිසා විශේෂයෙන්ම සභාපතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. වටවල වැව්ලි සමාගමට ලිපියක් මගින් දැනුම් දීමක් කරන්න. වෙනත් දිස්ත්‍රික්කවලින් මේ අපද්‍රව්‍ය ගේනවා. ඒ පිළිබඳව අවසරයක් ලබා ගන්න, නැත්නම් එක ස්ථානයක ගාල් කරලා ඒව පරිසර නිලධාරීන් ,සෞඛ්‍ය නිලධාරීන් විසින් හෝ පරීක්ෂණයක් සිදු කරලා කළුතරට හෝ අදාළ ස්ථානවලට යවලා පරීක්ෂණයක් කරලා සුදුසු තත්වයේ තියෙන පොහොර නම් මේ ප්‍රදේශයට භාවිතා කරන්න කටයුතු කරන්න. එහෙම නැත්නම් වහාම මේවා අත්හිටුවන්න කටයුතු කරන්න. පරිසර හානියක් තියෙනවා නම් එක වහාම නවත්තන්න ඔබතුමාට ශක්තිය හා නීතිමය උපදෙස් තියෙනවා. ඔබතුමාට හැකියාවක් තියෙනවා. තරංග මන්ත්‍රීතුමා කිව්වා වගේ ගේන අපද්‍රව්‍ය එයාලා කොහේ හරි යාඩ් එකක ගාල් කරලා ඇති. අපේ අනුමැතිය ඇතිව, පරිසර නිලධාරීන්ගේ අනුමැතිය ඇතුව පරිසරයට මුදාහරින්න කටයුතු කරන්න ඔබතුමාගේ නියෝගයක් නිකුත් කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. ඒක තමයි හොඳම ක්‍රමය. ඔය කටුපොල් අපද්‍රව්‍ය අඹරලා ගේන්නේ. මම කියන්නේ ට තල්ගස්වල පැත්තෙන් ගාල්ල සීමාවෙන් හා උඩුගම සීමාවෙන් අපේ බල ප්‍රදේශයට ඇතුළුවන ස්ථානවලදී පොලිසියෙන් යොදවලා හරි මේ අපද්‍රව්‍ය ගෙන එක නතර කරන්න කටයුතු කරන්න. නැවත අරගෙන යන්න කියන්න. නැත්නම් රජයේ පොර ගබඩාවෙන් පෝර ගෙනාවත් ගබඩා කරන්න ඕන. මොන ගබඩාවක්වත් නැහැ. කෙලින්ම දාන්නෙ වගාවට. ඒක නිසා අදාල තැන් වලට ලිපියක් යොමු කරන්න. අපි ඒකමතිකව සභාවේ යෝජනාව සම්මත කරනවා. ඒකට අදම ඔබතුමා ලියුම් සකස් කරලා, අදාළ ස්ථානවලට දැනුවත් කරලා, ඒ කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඊළඟට අපේ නිශාන්ත මන්ත්‍රීතුමා වැදගත් යෝජනාවක් ගෙනාවා. තල්ගස්වල නගරය ව්‍යාප්ත වීම පිළිබඳව. මේක ඉතින් අද ඊයේ දැකපු සිහිනයක් නෙවෙයි. අපි දැනගත්තා කවදහරි මේ නගරය පාලමෙන් එහාට යන බව. ඒ සඳහා දේශපාලනිකව යම් යම් කණ්ඩායම් උදව් උපකාර කළා. අපට ඒක සීමාවක් කරගන්න බැරිවුනා. ඒ අවශ්‍ය කට්ටිය තල්ගස්වල වත්තෙන් ඉඩම් අත්පත් කර ගත්තා. නමුත් අපට නාගොඩ කොටසින්වත්, තල්ගස්වල කොටසින්වත් ඉඩම් අත්පත් කරගන්න බැරි වුණා. ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනාවටත් ඔබතුමා යෝජනාවක් දාන්න. වහාම තල්ගස්වල වත්තෙන් නාගොඩ සීමාවට අයත් කොටසින් යම් ප්‍රමාණයක් ඉල්ලලා. පාර දෙපස දැන් තියෙන්නේ කටුපොල් වගාව මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යාලය තියෙන හරියේ, යන්ත්‍රෝපකරණ එක හරියේ පාර දෙපැත්තේ තියෙන්නේ කටුපොල් වගාව නිසා ඒවායින් ඉඩම් අත්පත් කරගන්න පුළුවන්. වතු සමාගම් වලට ඒවයි වටිනාකමක් දැන් කියන්න බැහැ. ඒ නිසා ඔබතුමා යෝජනා දාලා ඒක කරගන්න. නැත්නම් අපට ආදායම් එන්න තියෙන පොළවත් බේරගන්න බැරි තත්ත්වයක් තියෙන්නේ. නියාගම සභාව එක්ක තියෙන සහෝදරත්වය නිසා ඒ පොල කරගෙන යන්න පුළුවන්. ඒ පැත්තෙන් පොලක් දැම්මොත් අපිට එපා කියන්න බැහැ. සීමා කරන්න බැහැ. ඒක නිසා නගරය අපේ පැත්තට ව්‍යාප්ත කරන්න වැඩපිළිවෙළක් යොදන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට තල්ගස්වල පොළේ ප්‍රශ්න පිළිබඳව වනමල් මන්ත්‍රීතුමා කතා කළා. ඒ සියලු කාරණා සත්‍යයයි. මම හිතන්නේ ලබන අවුරුද්දේ ටෙන්ඩර් කිරීමේදී ටෙන්ඩර් පටිපාටියත් සමග දෙන උපදෙස් පත්‍රිකා වලට කරුණු රාශියක් ඇතුළත් කළ යුතුයි කියලා මම මේ අවස්ථාවේ මතක් කර සිටිනවා. හදිස්සියේ වතුර සැපයුම විසන්ධි වුනහම, විදුලිය විසන්ධි වුනහම සභාවට ක්ෂණිකව ඒක කරගන්න බැහැ. ඒවට කාර්මික නිලධාරී යවලා හදිස්සියේ ඒ දේවල් කරාට, ඒ කටයුතු එයාල සපුරාගෙන කරන්න ඕන කියලා උපදෙස් පත්‍රිකාවෙ දාන්න ඕන. බදාද වෙනකොට මේ තල්ගස්වල පොළ කොයිතරම් වටකරලා තිබුණත්, සමහර අවස්ථාවල ගොම බෙට්ටට කාඩ්බෝඩ් එක තියලා එතන වෙළඳාම් කරනවා. පහුගිය දවස්වල සෞඛ්‍ය නිලධාරීන් ගිහිල්ලා පර්මිට් එක නැති නිසා ඌරු මස් සීල් කරලා තිබුණා. ඒ නිසා ඒ කරුණු පිලිබඳව අපේ ටෙන්ඩර්කරුවන් එක්ක එකඟතාවයකට එන්න ඕන. ඒවට ලබන වර්ෂයේවත් කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඊළඟට අපි ගව මස් කඩය වැහුවා. දැන් ඌරු මස් කඩය තියෙනවා. ගවමස් නරකයි. හාමුදුරුවන්ට ඌරුමස් හොඳයි. ඒවා බැලුවහම විහිළු සහගත වැඩ. ඌරු මස් කඩයක් තියෙනවා නම් වෙනම ටෙන්ඩර් කරන්න. එසේ කිරීමෙන් තවත් මුදලක් ලබාගැනීමේ හැකියාව තියෙනවා. ඒ සඳහා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. දැන් අපි දැක්කා බද්දේගම පොළ, ගාල්ල ආශ්‍රිතව තියෙන පොළවල් කිහිපයකට මම ගොඩ වුණා. අපේ මාළු වෙළෙඳ පොළ තියෙන්නේ එහා කොනේ. ඒ නිසා ඒකට බිස්නස් නැහැ. උඩට ගොඩවෙලා එහාට යන්න ඕන. ඒ නිසා ඒ දන්න මනුස්සයා විතරයි එහාට ගිහිල්ලා මාළු ගේන්නේ. මාළු වෙළෙන්දෝ ඔක්කොම ඉන්නේ නගරේ. තල්ගස්වල නගරයේ මාළු වෙළෙන්දන් දහයක් විතර ඉන්නවා. පොළ ඇතුලෙ දෙන්නෙක් තුන්දෙනෙක් ඉන්නවා. ඒ නිසා එය ප්‍රශ්නයක් වෙලා තියෙනවා. බිස්නස් තියෙන්නේ පාරේ ඉන්න මාළු වෙළෙන්දට. මේවා නතර කරන්න ඔබතුමාට උපදෙස් දෙන්න පුළුවන්. තාවකාලිකව මේ මාළු වෙළෙන්දන් ලැගුම් ගෙන තියෙන්නේ අනිකුත් කෑම තියෙන ස්ථාන වල. රස කැවිලි වර්ග හදලා විකුණන අය අසළ. ඒ නිසා ක්‍රමය වෙනස් කරන්න ඔබතුමා කටයුතු කරන්න. ඒ වගේම අපි දැක්කා බද්දෙගම පොළේ මාළු වෙළඳාම සඳහා ස්ථාන සකස් කිරීමේදී පොලේ මායිමට වෙන්න තමයි ස්ථාන සකස් කරලා තිබුණේ. නමුත් ඒ වෙළෙන්දො ටික ඉස්සරහට අරගෙන තියෙනවා. මිනිස්සුන්ට බිස්නසුත් තියෙනවා. ඇතුල් වෙන තැනම මාළු වෙළෙඳුන් තමයි ඉන්නේ. ඒ නිසා අපටත් පුළුවන් කමක් තියෙනවා නම් මාළු වෙළඳ ස්ථාන වෙනස් කරන්න මිනිසුන්ගේ ව්‍යාපාරවලට හොඳයි. එවිට බඩු ගන්නට එන මිනිස්සු පොළට එන මිනිස්සු එළියට යන්නේ නැහැ. ඒ නිසා ඒ වගේ වෙනස් කිරීම් කරන්න වෙනවා. ඒ වගේම අපේ වෙරංග මන්ත්‍රීතුමාගේ යෝජනාවකට අනුව අපි උඩුගම පොළ සකස් කිරීමේදී විවිධ කරුණු කාරණා මේ අවස්ථාවේදි කතා කළා. විශේෂයෙන්ම මමත් මේ අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරු දැනුවත් කරන්න බලාපොරොත්තු වෙනවා. මේ උඩුගම පොළ සංවර්ධනය කිරීමේ කටයුත්තට එවකට හිටිය ලේකම්තුමිය, මමත්, ගරු සභාපතිතුමත්, කාර්මික නිලධාරීතුමා සහ අනෙකුත් නිලධාරී මහත්වරුන් කිහිප දෙනෙක් සමග ගිහිල්ලා තමයි පොළ අධීක්ෂණය කළේ. ඒ අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන් වෙළෙන්දන් එක්ක එකඟ වෙලා තිබුණා. අලුත් ගොඩනැගිල්ලට ව්‍යාපාරිකයන් ගේන්න. ඒ අය ස්ථාන වෙන් කරගෙන තිබුණා. ඒ සඳහා අපේ වෙරංග මන්ත්‍රීතුමා සද්භාවයෙන් විශාල වැඩ කොටසක් කළා. එතුමා නඩුහබවලට පැටලිලා විශාල වශයෙන් මුදලුත්, වාහනත් යොදවලා ඒක කරලා තිබුනෙ. නමුත් එකේ අවසාන අදියරේ ව්‍යාපෘති වලට යන්න බැරි වුණා. ඉතින් මම හිතන්නේ ලබන ජනවාරි වෙනකොට හරි මොන ක්‍රමයට හරි යම් මුදලක් වියදම් කරලා, ඒ සැලසුම් කළ ආකාරයට, ඇස්තමේන්තු කළ ආකාරයට මේ කාර්යය නිම කලොත් ව්‍යාපාරිකයෝ එන්න කැමතියි. ගරු සභබන්දු මැතිතුමනි, ව්‍යාපාරිකයෝ ඒ ස්ථානයේ වෙනම සටහන් කරලා, ඒ අයට දෙන්න පොරොන්දු වෙලා තමයි ඉන්නේ. රෙදි වෙළෙන්දන්ටත් සුදුසු ස්ථානයක් දීලා ව්‍යාපාරිකයන් එකඟතාවය මත තමයි ඒ සැලැස්ම සකස් කළේ. මම හිතන්නෙ ඒ විදියට කරගෙන ගියොත් තරංග මන්ත්‍රීතුමා කිව්වා වගේ අපද්‍රව්‍යත් එක්ක මිනිස්සු බඩු ගන්න යන ඒ ප්‍රදේශ වහලා දාලා, ඒවත් ගලවලා දාලා, ඒ සඳහා භූමිය සකස් කරනකම් කියලා දැන් එන මුදලට ඇස්තමේන්තුවක්

හදලා අපද්‍රව්‍ය තියෙන ගොඩනැගිලි ටික තාවකාලිකව අයින් කරලා, හොඳ ගොඩනැගිලි හදන්න සැලැස්මක් හදලා ඒවා එක්කම මේ පොළ සංවර්ධනය කරන්න කියලා මම මේ ගරු සභාවේ සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට ආදාහනාගාරය පිළිබඳව සහබන්දු මන්ත්‍රීතුමා කතා කළා. ඒ සඳහා නොයෙකුත් අවස්ථාවලදී ගරු සභාපතිතුමා උත්සාහයක් ගත්තා. නමුත් ඒ අවස්ථාවේදී මුදල් පිළිබඳ ප්‍රශ්නයක් ආවා. මම දන්නා තරමින් අපේ j.c.b. යන්ත්‍රය සඳහා දේශීය ණය යෝජනා ක්‍රමය යටතේ ණයක් අරගෙන තිබුනා. ඒ සඳහා වන ගෙවීම් ඒ වන විටත් තිබූ නිසා තමයි ඒ අවස්ථාවේදී තවත් කෝටි දෙකකට වගේ ණයකට යන්න අපට අවස්ථාව ලැබුණේ නැත්තේ. අපි කැමතියි අපේ වජිර අබේවර්ධන මැතිතුමා මේකට මැදිහත් වීම පිළිබඳව. නමුත් ගරු සභාව හමුවේ මම කියන්න කැමතියි. අපට ලැබෙන ඒ කෝටි දෙකක හෝ තුනක මුදල ණයක් වශයෙන් මිසක්, කෝටි 2 ක පරිත්‍යාගයක් හෝ වෙන ආධාරයක් යටතේ ආදාහනාගාර ඉදිකරලා නැහැ. වජිර අබේවර්ධන මැතිතුමා ඒ ණය මුදල ලබාගැනීම සඳහා මැදිහත් වෙයි. එසේ මැදිහත් වෙන්න කියලා ඉල්ලීමක් කරනවා. එහෙම තමයි ආණ්ඩුවක් ඉන්නකොට ප්‍රාදේශීය සභාව ආණ්ඩුවෙද විපක්ෂෙද කියලා නෙවෙයි. රටේ ජනතාවගේ සුභසිද්ධිය සඳහා තමයි මේ සියලු ආයතන පිහිටුවලා තියෙන්නේ. මධ්‍යම රජයේ ඉන්න ඇමතිවරු ඒ ඇසුරු කරන මන්ත්‍රීවරුත් එක්ක තියෙන සම්බන්ධතාවය උඩ මුදලක් ගේන්න පුළුවන් නම් ඒක අපි අගය කරනවා. ජනතාව අගය කරයි. ඒ පැසසුම ආණ්ඩුපක්ෂයේ අපට නැති වුණත් කමක් නැහැ. ඔබතුමාලට අපි පැසසුම දෙන්නම්. ආදාහනාගාරයක් ගේන්න උදව් කරන්න.

ඊලගට අපි පාලම් ව්‍යාපෘතිය පිළිබඳව ඔබතුමාලා කොයි තරම් කරුණු කාරණා කිව්වත් පාලම් ව්‍යාපෘති වලට සිදුවන සිදුවීම් පිළිබඳව මම කියන්නම්. හැබැයි වජිර මහත්තයා එක හොඳක් කළා. එතුමගේ ඕඩර් එකෙන් ප්‍රොජෙක්ට් බෝඩ් ටික දාලා වැඩේ පටන් ගත්තා. ඊට එහාදෙයක් කවුරුහරි කියනවා නම්, මේක මෙහෙමයි, මෙහෙමයි වුණේ කියලා උඩලමත්ත පාලම විවෘත කිරීම කරන දවසක හෝ අපටත් අවස්ථාවක් ලැබුණොත් මම කවදහරි ඔප්පු කරල පෙන්නනන්නම්. නමුත් වජිර අබේවර්ධන ඇමතිතුමාගෙ යම්කිසි දක්ෂතාවයක් තියෙනවා. එතුමා නිලධාරීන් එක්ක වැඩ කරන්න, නිලධාරීන්ට ඕඩර් දෙන්න දක්ෂයි. මොකද මීපෙ ගෙදර පාලම බලන්න ආපු අවස්ථාවක ප්‍රාදේශීය ලේකම් හරහා ලියුමක් එවනවා. මමත් ඒකට සම්බන්ධ නිසා මටත් පිටපතක් එක්ක. එහා පැත්තෙ ඉඩම් කට්ටි කරුවන්ගේ කැමැත්ත ඉල්ලලා ලියුමක් අරගෙන ප්‍රාදේශීය ලේකම්ට බාර දෙන්න කියලා. ඒ පාර ඊළඟ අවස්ථාවක් එනවා. ඒකේ කරලා බලන්න කියනවා. ඒ පාලමත් එක්ක තව කිලෝමීටර් දෙකකින් තව පාලමක් තියෙනවා. ඇටවරාව පාලම. ඊට මෙහා තියෙනවා වීමෝලගාව පාලම. වී මෝලගාව පාලම ළඟ පාලම් දෙකක් තියෙන නිසා මේක දෙන්න බැහැයි කියලා ලියුමක් එනවා. එහෙම තමයි නිලධාරීන් කටයුතු කළේ. නමුත් වජිර මහත්තයාගේ කීමට ඒ කටයුතු සිදුකළා. අවස්ථාවක් ලැබුණොත් ඒ ලියුම් කියුම් එක්ක මම ඒ කතාව ඔප්පු කරල පෙන්නනන්නම්.

ඊළඟට විශේෂයෙන්ම කියන්න කැමතියි. නිශාන්ත මන්ත්‍රීතුමා ප්‍රජා ජල ව්‍යාපෘති පිළිබඳ කතා කළා. ප්‍රජා ජල ව්‍යාපෘති සාර්ථක වුන එකක් තියෙනවා නම් කියන්න. සහබන්දු මහත්තයාගේ කාලයේ උත්සවයක් තියලා, වෙළෙඳ ප්‍රජාව ගෙන්නලා, නාගොඩ හන්දියෙ ප්‍රජා ජල ව්‍යාපෘතියක් කලා. කටුකිතුල් කන්දෙන්ද කොහෙද ජල පාර ආවෙ ගඟ හරහා ඇවිල්ලා ටැංකි බැදලා කරා. ඊට පස්සෙ ප්‍රාදේශීය සභාවට ඕක බාර දුන්නා. අපි රත්මලානෙන් මීල ගනන් කැඳවලා, රත්මලාන වෝටර් ෆොජෙක්ට් එකෙන් මීටර් ගෙනැල්ලා සවි කළා. නමුත් දැන් ඒවායේ අගිය අතක් නැහැ. කිසිදු මුදලක් සභාවට අය වුණේ නැහැ. මිනිස්සු ඒවා කඩා බිඳ දැම්මා. නඩත්තු කරගන්න විදිහක් නැහැ. නඩත්තු කරන්න විදිහක් නැහැ. ඊට පස්සේ අත් හැරියා. අපේ සම්බන්ධයක් නැහැ. ඊළඟට යටලමත්තේ හන්දියෙ ජල ව්‍යාපෘතියක් කලා. මයියොක්කාහේනෙත් වතුර බට ටිකත් නැහැ. ඊට පස්සේ උඩලමත්ත ජල ව්‍යාපෘතිය ඒකේ බට ටිකත් නැහැ. ඒ වගේම උනන්විටිය ජල ව්‍යාපෘතියක් කළා. මහ

ටැංකියක් බැන්දා. ඒකට මිනිහෙක් වැටිලා මැරුණා. දැන් කිසි දෙයක් නැහැ. උඩුගම, ගල්ලන්දලත් මුකුත් නැහැ. දැන් උඩලමත්තේ තව ජල ව්‍යාපෘතියක් කරනවා. මම ඒ ගැන හොඳ නරක කියන්න යන්නේ නැහැ. රුපියල් ලක්ෂ දහයක් වියදම් කරලා පියසේන ගමගේ ඇමතිතුමා විසින් සිදුකරනවා. මේවා විධිමත් වුනොත් හොඳයි. නැත්නම් කිසි වැඩක් නැහැ. මේවා නඩත්තු කරගන්න බැරිව, අපට තවත් බරක් තමයි මේ ජල ව්‍යාපෘති වලින් වෙන්නේ. ප්‍රජාවගේ දායකත්වය නැතුව, නීති රීති නැතුව හරි අමාරුවෙන් තමයි මේවා කරගන්න වෙන්නෙ කියලා මතක් කරනවා.

ඊළඟට විශේෂයෙන්ම දැන් සංවර්ධන කාර්යයන් කරනවා. අපේ ධනංජය මන්ත්‍රීතුමාට පොඩ්ඩක් වැරදුණා ලක්ෂ 10 නෙවෙයි වසමකට රුපියල් ලක්ෂ 50ක් ආවා. සමහර ව්‍යාපෘති වල ගානක් මිම්මක් නැහැ. ලක්ෂ පනහ, හැට පාරවල් කළා. එක කොටසක වැඩ ඉවර වුනහම, ඒ බව දැන්වුවහම තව කොටසකට මුදල් එනවා. හැබැයි සහබන්දු මන්ත්‍රීතුමනි, අපි කියන්නේ නැහැ. කවුරුවත් කොමිස් ගැහුවා කියලා. ගිය සභාවෙ බේරෙන්න බැහැ. මීට පෙර පැවති සභා කාලවල හැම සභාවකම වෙනත් කරුණු යටතේ කියන්නෙම එක එක මන්ත්‍රීවරුන් කොමිස් ගහන හැටි. කොහේ හරි පාරක් හැදුවොත් කියාවි. අන්න ලක්ෂ 50 ගැහුවා, ලක්ෂ දහයක් ගැහුවා. හැබැයි අපෙත් එක වරදක් තිබුණා. අපෙත් අඩුපාඩුවක් තිබුණා. අපේ නියෝජිත මහත්වරු ඕව කළා. හැබැයි අපි කියනවා ඔබතුමන්ලා කවදාවත් මේවායින් අයුතු ප්‍රයෝජන ගන්නෙ නැති විත්තිය. මෙතන ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලා කිසිකෙනෙක් එහෙම අයුතු ප්‍රයෝජනයක් ගන්නේ නැත කියලා අපි සහතිකයක් දෙන්න කැමතියි. මෙන්න මේ පිළිබඳව අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා, ගරු සභාපතිතුමාට මතක් කරනවා. ඒ වගේම නැවත වරක් කියනවා ඊළඟ මැතිවරණ ප්‍රතිඵලය, මේ සංවර්ධන කාර්යය ක්‍රියාත්මක නොවෙන විත්තිය. මේ සභාව හමුවේ නැවත සිහිපත් කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනි ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමනි, කතා කරන්න නෙවෙයි හිටියේ. ඒත් අපේ මේ මන්ත්‍රීවරුන්ගේ කතාත් එක්ක මට දෙයක් සිහිපත් කරන්න ඕන වුණා. දැන් කවුරුත් කියන්නේ, අපි මේ සංවර්ධන කටයුතු කරන්නේ මැතිවරණයක් ඉලක්ක කරගෙන කියලා. අපි 2015 ගෙනාවේ යහපාලන ආණ්ඩුවක්. අපි සංවර්ධන කටයුතු කරගෙන යනකොට ඒ වැඩ කරන්න ගොඩක් බාධක ආවා. අපේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පත්වෙලා තවම මාස හයයි වුනේ. යහපාලන ආණ්ඩුව ගිය ඔක්තෝබර් 26 වැනිදා අවසන් වුණා. යහපාලන ආණ්ඩුව කියන්නේ පක්ෂ දෙක තුනක සංකලනයක්. දැන් තනි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තියෙන්නේ. සංවර්ධන කටයුතුවලදී මූලිකත්වය අරගෙන කටයුතු කරන්නේ එක්සත් ජාතික පක්ෂය මේ මාස හය තුළ පමණයි. මම ඒක සිහිපත් කරනවා. ඒ වගේම තව කාරණයක් කියන්න ඕන. දැන් වරිපනම් කලාපයක් බවට උඩුගම නගරය පත් කරන්න යෝජනා වෙලා තියෙනවා. නමුත් උඩුගම නගරයට වැසිකිළි පද්ධතියක්වත් නැහැ. අපට ඒකටත් මුදල් ප්‍රතිපාදන වෙන් කර ගන්න අවස්ථාව තියෙනවා. නමුත් අපට ඒකට ඉඩමක් නැති එක තමයි ලොකුම අපහසුතාවය වෙලා තියෙන්නෙ. කොහෙන්හරි ඉඩමක් වෙන් කරලා දෙන්න කියලා ගරු සභාපතිතුමාගෙන් මම කලිනුත් ඉල්ලා සිටියා. ඒ ගැනත් සලකා බලන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. ඔබ සියලු දෙනාටම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මූලාසනයෙන් අවසරයි. පළමුවෙන්ම මම අද අධිකරණයේ පැවැත්වෙන නඩුවකට සම්බන්ධ වෙලා ප්‍රමාදවී සභා වාරයට සහභාගි වීමට ඉඩ ලබාදීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමන්ට හා සියළු මන්ත්‍රීවරුන්ට මගේ ගෞරවය ප්‍රකාශ කරනවා. මම මේ නඩු කටයුත්තට ඉදිරිපත් වුන මුල් අවස්ථාවේ ඉඳලා මේ දක්වාම 2007 වසරෙත් අපේ අජිත් සභාපතිතුමා, අපේ උපසභාපතිතුමා ඒ වගේම නිශාන්ත මන්ත්‍රීතුමා එදත් මට ඒ සභාවාර වල දී උදව් කළා. ඒ වගේම ගරු

සභාපතිතුමා ඒ සඳහා ගමන් පහසුකම් පවා සලසමින් මට උදව් උපකාර කළා. අද අධිකරණයේ පැවැති ඒ නඩුව මේ මස 23 වැනිදාට කල් ගියා. පළාත් පාලන පනතේ 215 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සහ සභිකයින්, ඒ වගේම නිලධාරීන් ආරක්ෂා කිරීමේ වගන්ති යටතේ මෙහි ප්‍රතිපාදන පැහැදිලිව සඳහන් වෙනවා. අද පැවැති නඩුව සඳහා අපට ඉදිරිපත් කරපු චෝදනා සම්බන්ධයෙන් අපට නඩු පැවරීමේදී මෙහි පැහැදිලිවම පළවෙනි විත්තිකරු නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභිකයකු බව සඳහන් කරලා තියෙනවා. ඒ වගේම දකුණු පළාත් සභාවෙන් මෙහි පැමිණෙන විමර්ශන නිලධාරිතුමිය සමග සාකච්ඡා කල විට, මෙම නඩු පැවරීමේදී සභිකයකු ලෙස සඳහන් කරලා තියෙනවා නම් කිසිම ගැටළුවක් නැහැ කියලා කිව්වා. කොහොමහරි මේ ලිපි ලේඛන අද තමයි උසාවියෙන් ලබාගත්තේ. ඒ නිසා මම විශ්වාස කරනවා. මේ සඳහා කිසිම නීතිමය බාධාවක් ඇති වෙන එකක් නැහැ කියලා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ පහළොස් වැනි වගන්තිය යටතේ මේ සඳහා ප්‍රතිපාදන තියෙනවා. ඉතින් ඒ පිළිබඳව මම ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලීමක් කරනවා. මට මේ සඳහා හැකි ඉක්මනින් හැකියාවක් තියෙනවනම්, මේ වකවානුව තුළ වැය වුන සහ මේ මාසේ වැය වුණ මුදල මට ලබා දෙන්න කියලා. මොකද බොහොම අපහසු කාලසීමාවක තමයි අපි මේ ගත කරන්නේ. ඒ සම්බන්ධයෙන් මම කතා කරන්නේ එපමණයි.

ඒ වගේම මේ සමෘද්ධි සහනාධාරය සම්බන්ධයෙන් කීප අවස්ථාවකදීම අදහස් ප්‍රකාශ කළා. මම හිතන්නේ ලක්ෂ හතරහමාරක් පමණ රටේ සමෘද්ධිය දීලා ඉවරවෙලා තමයි. අයදුම්පත්‍ර කැඳවන්න පටන් ගත්තෙ. දැන් තැපැලේ මේ වන විට ලක්ෂ දෙකක විතර අභියාචනා හිරවෙලා තියෙනවා. ලක්ෂ එකහමාරක් විතර තැපෑලෙන් භාරගෙන කටයුතු කරමින් පවතිනවා. ඒ නිසා මම හිතන්නේ ඉදිරි ජනාධිපතිවරණය දක්වා මේ සමෘද්ධි සහනාධාරය අයදුම්පත්‍ර නැත්නම්, ලබා දීපු අභියාචනා වලට සමෘද්ධිය ලබා දෙන්න පුළුවන්කමක් ලැබෙයිද කියලා මම විශ්වාස කරන්නේ නැහැ. නමුත් මේකෙ ක්‍රමවේදයක් නැහැ. ඒ වගේම විශේෂයෙන් අපේ උනන්විටිය කොට්ඨාශයේ එම්. එම්. මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ ජොබ් එකක් තියෙන j.c.b. එකක් තියෙන පුද්ගලයාට සහනාධාරය තියෙනවා. එම j.c.b. එකේ වැඩ කරන රියදුරු මහත්තයට සමෘද්ධිය නැහැ. ඒ වගේම උඩවැලිවිටිය බටහිර කටුමැටි ගහපු එකම ගෙයයි තියෙන්නෙ. වයෝවෘද්ධ කාන්තාවක් සහ පුතෙකු සමගම පවුලේ සාමාජිකයින් කිහිප දෙනෙක් ඉන්නවා. ඒ අයටත් සමෘද්ධි සහනාධාරය අනිවාර්යෙන් ලබා දෙන්න ඕන. නමුත් ඒ ලැබිලත් නැහැ. සමහර අවස්ථාවන්වලදී ගමේදි අහන්න දකින්න ලැබෙන්නේ සමෘද්ධි සහනාධාරය මගෙන් ඉල්ලගන්න කියලා තමයි සමහර අයට කියලා තියෙන්නෙ. ඒ ගැනත් මගේ බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. හැබැයි අපේ මන්ත්‍රීතුමිය නෙවෙයි මේවා කියන්නේ. අනික මට එහෙම සමෘද්ධිය දෙන්න හැකියාවක් නැහැ. අපේ රටේ සමෘද්ධිය මීට වඩා ක්‍රමවේදයකින් යුතුව ලබා දුන්න නම් හොඳයි කියලා මම කියනවා.

ඒ වගේම අපේ මේ සියලු දෙනාම මේ වෙලාවෙදි අවුරුදු හතරක කාලයක් තුළදී රටේ ජනතාව ඉතාමත් පීඩිත තත්ත්වයට පත්වුණා. එවාට උදාහරණ වශයෙන් කියන්න පුළුවන් මේ රටේ ගම්පෙරළිය, ඒ වගේම වෙනත් වැඩසටහන්. ඒ යටතේ අපි දැක්කේ නැහැ. මේ රට තුළ ඇවිදලා බලනකොට රටෙන් වැඩි පිරිසක් වගා කළ හැකි ඉඩම් ප්‍රමාණයක් කැලේට ගිහිල්ලා. ඒ වගේම ඒවා නිසි ක්‍රමවේදයකට සකස් කරන්න අවස්ථාව ජන ජීවිතයට බලපානවා. අපි 2014, 2013 මේ සංවර්ධන යෝජනා, පාරවල් කොන්ක්‍රීට් කරන්න මංමාවත් හදන්න මම හිතන්නේ මේ ඔබ රජය විසින් කරනවා වගේම ඒ වෙලාවෙත් රටපුරාම සවර්ධන යෝජනා ක්‍රියාත්මක කළා. අපටත් එදා වැරදුනා. හැබැයි අපි යම් විදියකින් හරි ඇට පැකට් එකක් හරි බෙදුවා. ඒ බෙදූ ඇට පැකට් එකත් විවේචනය කළා. කොහොම උනත් මතක තියාගන්න ටේ මිනිස්සුන්ගෙ අවශ්‍යතාවය පාරවල් කොන්ක්‍රීට් කිරීම විතරක් නෙවෙයි. ඒකත් අවශ්‍යතාවයක්. නමුත් පළමුවෙන්ම මිනිස්සු ජීවත්වෙලා ඉන්න ඕන. ඒ සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය වෙලා නැහැ. ඒ නිසා මතක තියාගන්න. ඒකට අපි හැම දෙනාම වගකියන්න

ඕන. මේ රජය තුළිනුත් මම ඒක දකින්නේ නැහැ. අපි කවදාවත් අහලා නැහැ මන්දපෝෂණය හැදිලා එදාවේල කන්න බැරි කවුරුවත් මැරිලා කියලා. අපි මොන සුරංගනා කතා කතා කලත්, යම් පිරිසක් ඉතාමත් ආර්ථික අපහසුතාවයකට පත්වෙලා ඉන්නවා. පහුගිය දවස්වල අයවැයෙන් සම්පූර්ණ යෝජනා කළේ ණය යෝජනා ක්‍රම පමණයි. මිනිස්සුන්ට එක එක විදිහේ ණය ඉදිරිපත් කරල මිනිස්සු ණය කාරයෝ කරන වැඩපිළිවෙළක් තමයි කරන්න හැදුවෙ. මම මේවා විවේචනය කරනවා නෙවෙයි. මම කියන්නේ කොයි රජය වුණත්, මේවා සමබර කරලා කරගත්තොත් හොඳයි. සමහර වෙලාවට අපිටත් මේ ජනජීවිතය බලපාන දේවල් වෙනවා. මේවා සභාවට අයිති දේවල් නොවෙයි කියන්න පුළුවන්. නමුත් සියළු දෙනා කතා කරපු නිසා මේවට උත්තර දෙන්න තමයි මම ප්‍රකාශ කරන්නෙ. ඒ නිසා අපි පැහැදිලිවම සඳහන් කරනවා. අපට ඔය පාලම් බෝක්කු පාරවල් දැම්මා වගේම, ජන ජීවිතයට බලපාන දේවල් නොකරොත්, අපට ඉතාමත්ම නුදුරේදී මේවට අච්චු විඳින්න සිදුවෙනවා. ඒ වගේම මාස 6,7,8යි මේ රජය බලයට පත්වෙලා කියලා. නමුත් මේ රටේ දහනවවෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරගෙන, ජනාධිපතිවරයාගේ බලතල අහිමි කරලා, ඉතාමත් ප්‍රබල අග්‍රාමාත්‍යවරයෙකු පත්වෙලා. ඒ නිසා එකෙන් ගැලවෙන්න කාටවත් බැහැ. ඒ නිසා කවුරුහරි කියනවා නම්, මම කියනවා අනිවාර්යෙන්ම මේ රජය මැතිවරණ ඉලක්ක කරගෙන තමයි මේ වැඩ පිළිවෙල කරන්නේ කියලා.

ඊලග එක තමයි ඔබතුමා එල්ලුම් ගහ ගැන සඳහන් කළා. රටේ තියෙන නීතිය ක්‍රියාත්මක වෙනවනම්, මේ එල්ලුම්ගහ ක්‍රියාත්මක කරන්න අවශ්‍යතාවයක් නැහැ. මතක තියාගන්න. අද බන්ධනාගාර ගතවෙලා ඉන්න පිරිසගෙන් වැඩිම පිරිසක් ඉන්නේ නිවැරදි මිනිස්සු. ඒ නිසා නීතියේ ආධිපත්‍යය, ඉස්සෙල්ලා මේ රටේ තියෙන නීතිය ක්‍රියාත්මක කරලා ඉවරවෙලා, අවසානයේ මේ නීතිය ක්‍රියාත්මක කරනවා නම්, එල්ලුම්ගහ වගේ දේවල් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයක් මම දකින්නේ නැහැ. ඒ නිසා රටේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැතුව රටේ නීතිය වල් වැදිච්ච අවස්ථාවක් තමයි දැන් තියෙන්නෙ. ඊළඟට මත්ද්‍රව්‍ය උවදුර පිළිබඳ සඳහන් කළා. අද ගම්බද බොහොම සුළු පිරිසක් තමයි අරක්කු වගේ ද්‍රාවණ මත්ද්‍රව්‍ය පාවිච්චි කරන්නේ. අනෙක් සියලුම දෙනා බොහෝ වෙලාවට පුරුදුවෙලා තියෙන්නේ භයානක විෂ මත්ද්‍රව්‍ය. ඒ නිසා එල්ලුම් ගහ ක්‍රියාත්මක වෙන නෙවෙයි, මේ මත්ද්‍රව්‍ය මෙරටට එන ප්‍රධාන මාර්ග අවහිර කරන්න ඕන. බෞද්ධාගමික රටක් හැටියට එල්ලුම්ගහ ක්‍රියාත්මක කිරීම සුදුසු වැඩපිළිවෙළක් නෙවෙයි කියලා තමයි මම හිතන්නෙ. මොකද අපි හැමතිස්සෙම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කරන රටක් හැටියට, නීතිය නිවැරදිව ක්‍රියාත්මක වෙනවනම්, එල්ලුම්ගහ ක්‍රියාත්මක කරාට කමක් නැහැ. එල්ලුම්ගහට එහා ගිය මේ එල්ලුම්ගහ ක්‍රියාත්මක නොවීම තමයි. අද මේ රටේ තියෙන අපරාධ වැඩිවීමට හේතුව වෙලා තියෙන්නේ. අපරාධකරුවන් මැඩපවත්වන්න එල්ලුම්ගහට වැඩිය ගෙන ආ යුතු වැඩපිළිවෙලවල් තියෙනවා.

ඒ වගේම විශේෂයෙන්ම අපේ ගරු සභාපතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. පොලීසිය සහ අපි ප්‍රදේශවාසීන් එකතුවෙලා ශ්‍රමදාන ව්‍යාපාරයක් කළා. ඒ සඳහා ඔබතුමා එදා තමන්ගේ දවසම කැප කරමින්, අවශ්‍ය යානවාහන, කම්කරුවන්, යන්ත්‍රසූත්‍ර ලබාදෙමින් ඉතා විශාල දායකත්වයක් හා ශක්තියක් ලබා දුන්නා. ඒ පිළිබඳව ඔබතුමාට අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඒවගේම අපට කවුරු මොනවා කිව්වත්, කවුරු මොන දේවල් කළත්, අවසානයේ අපි මේ මැතිවරණය ඉලක්ක කරගෙන යන ගමන් මාර්ගයේදී, ගම්පෙරළිය වැඩසටහන කතා කළා. අපි සංවර්ධන කටයුතු කරනකොට අපට රිදුනෙ නැහැ. නමුත් මේ සංවර්ධන ක්‍රියාවලිය සිදුකරද්දී මීට වඩා ක්‍රමානුකූලව සිදුකරනවා නම් හොඳයි. ප්‍රධාන මංමාවත් පිළිබඳ සැලකිල්ලක් දක්වලා කටයුතු කරනවා නම් ගොඩක් හොඳයි. අපේ වැලිවිටිය කොට්ඨාසයේ යම් යම් ප්‍රධාන මාර්ග වල ගමනාගමන අපහසු තැන් තියෙනවා. නමුත් නිවැසියන් කිහිපදෙනෙක් යන පාරක් වෙනුවෙන් රුපියල් ලක්ෂ දහයක් යොදවලා අතුරු මාර්ග කොන්ක්‍රීට් කරනවා. මේ කටයුතු යෝජනා කරල යවද්දී සමහර වෙලාවට අපේ මන්ත්‍රීවරු දන්නෙ නැති අවස්ථාවන් තියෙනවා. එනිසා ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමුකරලා,

මාර්ග වැඩිදියුණු කරනවා නම් හොඳයි කියන එක මම මේ අවස්ථාවේ දී ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා. පක්ෂ පාට භේදයකින් තොරව ප්‍රාදේශීය සභාවේ යමක් කරන්න ඔබට අපට හැකියාව ලැබෙනවා නම්, ඒකට තමයි මේ පුරවරයේ ජනතාව අපට ඡන්දෙ දීලා, ප්‍රාදේශීය සභාවට සම්බන්ධ කරලා බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා කවුරු මොන දේ කලත්, මොන විදියට කතා කළත්, අපි වෙනුවෙන් අපට යමක් කරන්න පුළුවන් නම් ඒ සඳහා අපේ දායකත්වය නිරන්තරයෙන්ම ලබාදිය යුතුයි. ඒ වගේම ඉතාම නුදුරේ පැවැත්වෙන ජනාධිපතිවරණයෙන් අපි අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලබනවා. මොකද මේ රටේ ජනතාව සංවර්ධනය නෙවෙයි කතා කරන්නේ. රටේ අහිංසක ජනතාවට බලපාන ආර්ථික අපහසුකම්, නොසැලකිල්ල පිළිබඳව. දහවෙනිදා වෙනකොට තෙල් සූත්‍රය ලැබෙනවා. එකොළොස්වැනිදා වෙනකොට ප්‍රකාශයට පත් කරනවා. අවසාන වතාවටත් ගෝඨාභය රාජපක්ෂ මහත්මයා මේ රටේ ජනාධිපති කරනවා කියන එකත් ප්‍රකාශයට පත් කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. කොතැනින් පටන්ගෙන කොතනින් ඉවර කරන්න ද කියලා මට හිතාගන්න බැහැ. මම පළමුවෙන්ම තල්ගස්වල පොළ බදුකරු අමල් ප්‍රසාද් 2017 වර්ෂයේ හිඟ බදු සහ පොලී ගෙවීම සම්බන්ධව ලිපියක් ඉදිරිපත් කළා. ඒ ගැන අපට කතා කරන්න බැරි වුණා. රුපියල් තිස්තුන් දහස් අසූ හතක හිඟයක් තියෙනවා. ගංවතුර නිසා එක පොළ වාරිකයක් නිදහස් කරන්න කියලා ඔහු ඉල්ලීම් කරලා තිබුනා. නමුත් අපිට වාරිකය නිදහස් කරන්න බැරි වුණා. ඊට පස්සේ බදුකරු අපට ඇවිල්ලා කිව්වා. මේ මුදල මාසිකව, අවුරුද්දක් ඇතුළත ගෙවන්නම්. ඒ සඳහා කල් දෙන්න කියලා. එතුමත් යම් අපහසුතාවයකට පත්වෙච්ච නිසා, සභා තීරණයක් අරගෙන අපි ඒ කටයුත්තට සහාය ලබා දෙන්නම් කියලා අපි කිව්වා. ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම අහන්න කැමතියි. මේකට මොකද කරන්නේ. මේ සම්පූර්ණ මුදලම සභාවට අය කර ගන්න තියෙනවා. මේකට නඩු දාන්නත් පුලුවන්. නමුත් එතුමා අපෙන් ඉල්ලීම් කරනවා. ඒ නිසා මේ පොළ බදුකරුගෙන් නීත්‍යානුකූලව ලිපියක් අරගෙන, අත්සන් අරගෙන, ඔහුට එම මුදල ඒ ආකාරයට ගෙවන්න අවස්ථාව ලබා දෙමු.

ඊළඟට බඳාදා සතිපොළේ කුණු කසල ඉවත් කිරීමේදී ගැටලුවකට පත් වෙලා තිබුණා. පොළ බදුකරුට සේවකයන් නොමැතිකම නිසා, පොළ බදුකරු සුමානයකට අපට රුපියල් 3000 ක මුදලක් ගෙවන්නම් කියලා, අපේ සේවකයෝ දෙන්නෙක් දාලා සුද්ද කරලා දෙන්න කියලා ඉල්ලුවා. අපි දැනට ඒකෙන් සෑහීමකට පත් වෙමු. නැත්නම් මොකද මේක කරගෙන යන්න බැරිවෙනවා. ගරු මන්ත්‍රීවරුනි, ටෙන්ඩර් එක අනුව, පොළ බදුකරු පොළ සුද්දකරලා, කුණු එකතු කරන්න වගකීමෙන් බැඳී ඉන්නවා. නමුත් එයාට මිනිස්සු නොමැති හේතුවෙන්, ගිවිසුමක් සකස් කරලා, ඒ අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගරු උප සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, නාගොඩ ගම්මැද්දේගොඩ පාරේ ප්‍රධාන පාලම අසළ සිට කොටස අද දින සිට කොන්ක්‍රීට් කිරීම සඳහා පාර වසා දැමීමට අවශ්‍ය බව අදාළ කොන්ත්‍රාත්කරු ඉල්ලීමක් කර ඇත. එබැවින් අද දින සිට එම මාර්ගය දින කිහිපයක් වසා තැබීමට සිදු කරනවා.

ගරු මන්ත්‍රීවරුනි, නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන අවශ්‍යතාවයක් තමයි ආදාහනාගාරයක් ඉදි කිරීම. අපේ හිටපු සභාපතිවරුන් සියලු දෙනාම මේ සඳහා උත්සාහ ගත්තා. එක් එක් අවස්ථාවල උනන්දු වෙලා මුල්ගල් තියන්න පවා ස්ථාන වෙන් කරගෙන අදාළ කටයුතු කළා. නමුත් ඒ කටයුතු කරද්දී යම් බලපෑම්වලට ඇහුම්කන් දෙන්න සිදු වූ නිසා ඒ උත්සාහයන් අතරමඟ නැවතුනා. නමුත් ආදාහනාගාරයක අවශ්‍යතාවය අපේ සභාවට දැඩිව බලපානවා. මම සභාපති වෙලා ඉන්න කාලය තුළ ඒ ආදාහනාගාරය ඉදි කරල තියන්න ඕන කියලා මම කල්පනා කළා. ඒ නිසා මම උනන්දු වුණා. ඒ

උනන්දුවීම මත වර්තමාන ආණ්ඩුවේ ඉඩම් බලතල තියෙන ගයන්ත ඇමැතිතුමා, වජිර අබේවර්ධන ඇමතිතුමාටත් අපි මේ ගැන දැනුවත් කරාම පූර්ණ සහය දක්වලා ඉඩම් පිළිබඳවත්, මූල්‍ය තත්ත්වය පිළිබඳවත්, අපට අවශ්‍ය කරුණු කාරණා ටික ඉටු කර දෙන බවට පොරොන්දු වුණා. විශේෂයෙන්ම ඉඩම් ලබා ගනිද්දී අපි බැලුවේ අපට මධ්‍යස්ථ ස්ථානයක්. වළකුඹුර ප්‍රදේශය ඇතුලත ඉඩම් බලන්න ගියා. එක ගලෙන් කුරුල්ලෝ දෙන්නෙක් මරා ගන්න බලාපොරොත්තුවෙන් තමයි ප්‍රියන්තා මන්ත්‍රීතුමියලගෙ පැත්තෙන් ඉඩම් බැලුවෙ. එනම්, පාර හදා ගැනීමට සහ ආදාහනාගාරයට ඉඩමක් ලබා ගැනීම සඳහා. නමුත් වැව්ලි සමාගමෙන් ඒ ස්ථානය අපට ලැබුණේ නැහැ. වැව්ලි සමාගමත් එක්ක මම බොහොම තදින් කතා කරලා අමාත්‍යතුමාටත් කියලා, කොහොමහරි වළකුඹුර ප්‍රදේශයේ ජයබිම අධ්‍යාපන ආයතනයට උඩ අක්කර දෙකක වගේ ස්ථානයක් ආදාහනාගාරය සකස් කිරීම සඳහා වෙන් කරලා තියෙනවා. මම එයිට්කන්ට් එක්ස්පෙන්සර් වැව්ලි සමාගමට ගියා. අමාත්‍යතුමා සමග සම්බන්ධ වෙලා අදාළ සමාගමට කථා කළා. මට හිතෙන්නේ ලබන සුමානෙ විතර මැනුම් කටයුතු කරලා එය අපට ලබා දේවි. ඒ ස්ථානයට තවම ඇස්තමේන්තු සකස් කළේ නැහැ. ලක්ෂ දෙසීයකට ආසන්න ප්‍රමාණයක් යාවි. මම බලාපොරොත්තු වුණේ මෙම මුදල් ණය මුදලක් ලෙස ගන්න. නමුත් වජිර අබේවර්ධන ඇමතිතුමා ලක්ෂ දෙසීයක් අමාත්‍යාංශ ප්‍රතිපාදන හැටියට ලබා දීමට එතුමා අපට පොරොන්දු වුණා. යථා කාලයේදී ආදාහනාගාරයේ කටයුතු ටික සිද්ධ වේවි.

ඒ වගේම තමයි වනමල් මන්ත්‍රීතුමා තල්ගස්වල පොළ පිළිබඳව කතා කළා. නන්දන මන්ත්‍රීතුමා, තල්ගස්වල පොළ පිළිබඳව අපි මොකද්ද කළේ. කියලා ඔබතුමාලා දන්නවා ඇති. තල්ගස්වල මෙහා පැත්තේ ඉඩම් දැන් අපි ලබාගෙන මැනුම් කටයුතු කරලා ඉවරයි. ඒ ස්ථාන අපට භාර දෙන්න විතරයි දැන් තියෙන්නෙ. ඒවත් භාරදුන්නම ඉදිරියේදී වෙළෙඳ සංකීර්ණයක් ඉදි කරන්න අපට අවස්ථාවක් ලැබේවි. ඊළඟට තල්ගස්වල පොලේ වෙනදාට වඩා යම් ප්‍රතිඵලදායක තත්වයක් තියෙනවා. නමුත් විදුලිය කතන්දරේ දී මම නිලධාරීන්ට තමයි දොස් කියන්නේ. මම සුමාන දෙක තුනකට උඩදි විදුලි කාර්මිකයත්, අදාළ නිලධාරිණියත් යවලා ඒ වැඩේ කෙරෙව්වා. සල්ලිත් වියදම් කළා. මම දන්නෙ නැහැ මොකද්ද මේකෙ තේරුම කියලා. මේ පිළිබඳව ලේකම්තුමිය ඒ අවශ්‍ය කටයුතු සොයල බලල කටයුතු කරන්න. මොකද හැමදාම විදුලිය ප්‍රශ්න. මම පොළ බදුකරුටත් කිව්වා ඔන්න මේ පාර හරියට හදලා යනවා ආයෙ කතා කරන්න එපා කියලා. වනමල් මන්ත්‍රීතුමා පොළ ගැන අපි අහක බලාගෙන ඉන්නෙ නැහැ. තල්ගස්වල පර්චස් 20 ක ඉඩම් ප්‍රමාණයක් මැණුම් කටයුතු කරලා අපි ලබා ගෙන තියෙන්නෙ. දැන් එහි තියෙන අනවසර ඉදිකිරීම් ඉදිරියේදී ඉවත් කරලා, අපි ඒ සියලුම අනවසර කරුවන්ටත් සාධාරණය ඉටු කිරීමට කටයුතු කරනවා.

ඒ වගේ තමයි උඩුගම පොළ පිළිබඳව, අපි ආපුදා ඉඳලම කතා කරනවා. උඩුගම පොළ සංවර්ධනය පිලිබඳව. ඇත්තටම ඒකට ලක්ෂ හැත්තෑවක මුදලක් වෙන් වෙලා තියෙනවා. පසුගාමී ප්‍රාදේශීය සභාවක් හැටියට පළාත් පාලන අමාත්‍යාංශයෙන් එවපු යෝජනා ඉල්ලුවම, උඩුගම පොළ තමයි යෝජනාවට දාලා තිබුනේ. ඒ කටයුත්තේදී උඩුගම පොල වෙනුවෙන් රුපියල් ලක්ෂ හැත්තෑවක් ඇස්තමේන්තු කරලා යවලා තිබුණා. මේ වනතුරු ඒක ඉටුවෙලා නැහැ. මම ගිහිල්ලා යෝජනාව උඩහට දාගත්තා. නැත්නම් ඒ මුදලුත් වෙන පොළවල්වලට යනවා. අපට වෙන් කරලා තිබුණේ නැහැ. මම ඒ පිලිබඳව දන්න ජ්‍යේෂ්ඨ සහකාර ලේකම්වරයෙක් හමුවෙලා, ඒ අවශ්‍ය කටයුතු කරද්දී, වජිර ඇමතිතුමාටද ඒ ගැන මතක් කළා. නුදුරු දිනයකදී පසුගාමී ප්‍රාදේශීය සභා වලට දියයුතු ආධාර උපකාර පිළිබඳ සාකච්ඡාවේදී, මේ උඩුගම පොළ පිළිබඳ යෝජනාව ඇතුළු වෙනවා කියලා සහකාර ලේකම්තුමත් කිව්වා. ඒකෙදි මම හිතන්නේ මේ ලක්ෂ 70 ක මුදල මේ අවුරුද්ද අවසන් වෙන්න කලින් ලැබෙයි. 2018, 2020 සංවර්ධනය යෝජනා යටතේ හැකි ඉක්මනට අපි මුදල් දෙන්න බලනවා කිව්වා. ඒ නිසා අපේ විශ්වාසයක් තියෙනවා මේක ඉක්මනට ලැබෙයි කියලා. ඒ වගේම අමාත්‍යතුමා ප්‍රකාශ කළා ඉදිරියෙදි සෘජුවම පළාත් සභාවෙන් ප්‍රාදේශීය සභාවට මුදල් ලැබෙයි කියලා. නමුත් කියන්න

කනගාටුයි. අපට එතරම් මුදල් එන්නේ නැහැ. අපට මුද්දර ගාස්තු බොහොම සුළු ප්‍රමාණයක් තමයි ලැබෙන්න තියෙන්නේ. ලක්ෂයක්, එකහමාරක්, දෙකක් වගේ මුදලක්. මා පෞද්ගලිකවම ගොස් සුනිල් දහනායක ලේකම්තුමා හමු වුනා. ඒ හමුවීම තුලින් අපට එන්න තිබුණු ඒ ලක්ෂ 71 ක මුදල පළමුවෙන්ම අපට ලබා දුන්නා. ඊට පස්සේ තමයි ආණ්ඩුකාරතුමා ලක්ෂ පහමාරක් පහුගිය දවස්වල එවල තිබුනෙ. ඒ ඇරෙන්න අපට එන්න වෙන මුදලක් නැහැ. නගර සභාවලට නම් හොටෙල්වලින්, ඉඩම් වෙන්දේසිවලින් කෝටි ගණන් මුදල් ලැබෙනවා. නමුත් අපට එහෙම ආදායමක් අවුරුදු ගණනාවකටවත් ලැබෙන්නෙ නැහැ.

ඒ වගේම මේ බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය වෙනවයි කියලා, අපේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කියවුනා. ඇත්ත හුඟක් සංවර්ධනය වෙනවා. ඒක හොඳයි. නමුත් මේ කටයුතුවලදී අපිත් එක්ක කිසිම සම්බන්ධතාවක් ඇත්තෙ නැහැ. අපි ළඟට එන්නේ අවසර ගන්න විතරයි. ඉතිං එතෙන්දි අපට අවසර නොදී ඉන්න පුළුවන්. වෙන ප්‍රාදේශීය සභාවල කොන්ත්‍රාත්කරු කවුරු වුනත්, ප්‍රාදේශීය සභාවෙන් තමයි ඇස්තමේන්තු සකස් කිරීම, අත්සන් කිරීම සිද්ධ කරන්නේ. ප්‍රාදේශීය සභා වලින් තමයි සේරම බලය අරගෙන තියෙන්නේ. අපි ඒ බලතල ප්‍රාදේශීය ලේකම්තුමියට ලබාදීලා තියෙනවා. අදාල බල ප්‍රදේශයේ මේ සංවර්ධන කටයුතු අපිත් එක්ක සම්බන්ධීකරණය කරනව නම් හොඳයි කියලා මම කියනවා. අපේ සංවර්ධන ක්‍රියාවලියේ, අයවැය වාර්තාවේ සඳහන් පාරවල්, මාර්ග සංවර්ධනය ඒ හා සමානව තමයි ඒව කරන්න ඕන. සමහර අය කියනවා අත්‍යවශ්‍ය මාර්ග සකස් වෙන්නේ නැහැ, ගෙවල් දෙක තුනකට යන මාර්ග සකස් කරනවා කියලා. ඒ අවස්ථාවේදී අපිත් එක්ක සම්බන්ධීකරණය වුනානම්, අපි කියනවා මේක තමයි සංවර්ධනය විය යුතු තැන. ඊළඟට මෙන්න මේ මාර්ගය සංවර්ධනය කරන්න කියලා. අපිත් එක්ක කිසි සම්බන්ධයක් නොමැති නිසා, එවැනි අතපසුවීම් සිද්ධ වෙනවා. ප්‍රශ්නේ තියෙන්නේ සංවර්ධන ක්‍රියාදාමයේදී පක්ෂ දෙපැත්තක් නිසා ඒ කටයුත්ත වෙන්නෙ. අපේ බල ප්‍රදේශයේ මොනම හෝ පාරක් සංවර්ධනය වෙනවා නම් අපි ඒ ගැන සතුටු වෙනවා. ඒ නිසා මෙතන පක්ෂ භේදයක් නැහැ. කවුරුත් පාරෙ යනවා, කවුරුත් ඒක භුක්ති විඳිනවා.

ඒ වගේම ජල යෝජනා ක්‍රම පිළිබඳව කතාකරද්දී, කැප්පිටියගොඩ ජල යෝජනා ව්‍යාපෘතියට මමත් සහභාගි වුණා. ගාමිණී සුසන්ත උපසභාපතිතුමා කිව්වා වගේ මේ ජල යෝජනා ක්‍රමයන් මම හිතන්නේ සාර්ථක නැහැ. පසුගිය කාලයේ උනන්විටියේ ජල යෝජනා ක්‍රමයට ලක්ෂ තිස් ගාණක් වැය කළා. අද එය අසාර්ථක වෙලා. ඒ වගේම හැම තැනම ජල යෝජනා ක්‍රම අසාර්ථක වෙලා තියෙනවා. ගඟෙන් ජලය පොම්ප කරලා ලබා දෙන එක තමයි හොඳම ජල යෝජනා ක්‍රමය වෙන්නෙ. වර්තමානයේ නාගොඩ ප්‍රදේශයේද ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා අපේ ඉඩමක් තමයි දීලා තියෙන්නේ. මෙම යෝජනා ක්‍රමයට ගඟෙන් ජලය ලබා ගැනීමයි කරන්නෙ. මම එදා කතාවෙනම් කිව්වේ, මේ ජල යෝජනා ක්‍රමවලදි, ප්‍රාදේශීය සභාවෙ සම්බන්ධයක් ඇත්තෙම නැහැ කියලා. මේ පිළිබඳව වගකිව යුතු නිළධාරියෙක් නොමැති බවත්, දිසාපති කාර්යාලය මේ ගැන දැනුවත් නොමැති බවත්, නිලධාරීන් පමණක් දැන සිටියට, එයට වගකිව යුතු නිලධාරීන් මේ පිළිබඳව දන්නේ නැහැ. නමුත් වතුර උඩින් දෙන්න විදියක් නැහැ. පාරවල් වලින් තමයි වතුර දෙන්න ඕන. පාරවල්වලින් දෙනකොට සභාවෙන් අවසර ගත යුතුයි. පාරවල් කඩනකොට අපට අයකිරීම් කරන්න වෙනවා. ඉතින් ඒ අයකිරීම් කරද්දි, ඒ මුදල් ගන්න වෙන්නේ පාරිභෝගිකයාගෙන්. අන්තිමට පාරිභෝගිකයා අසරණ වෙනවා. මේ ජල ව්‍යාපෘති වලදී මිනිස්සුන්ගෙන් සල්ලි එකතු කරනවා. ආණ්ඩුවත් මැදිහත් වෙනවා. අතරමඟදී නතර වුනොත් මේ සඳහා වග කියන්න කෙනෙක් නැහැ. ගරු මන්ත්‍රීතුමා, දැන් අපි මුදල් අය කරන්න ගියොත්, පාරිභෝගිකයො කියනවා අන්න ආණ්ඩුවෙන් අපට වතුර දෙනවා, ප්‍රාදේශීය සභාවෙන් සල්ලි ගන්නවා. අපි සභාව සම්බන්ධ වුණාම යම් සහනදායී පියවරට යන්න පුළුවන්. ඒ වගේම ඔය අතරමගදී කටයුත්ත නතර වුනොත් ඔය නිලධාරීන් කවුරුවත් වග කියන්නේ නැහැ. ඒ

නිසා ප්‍රාදේශීය සභාව සම්බන්ධ වෙනවනම්, එතකොට අපට උදව් උපකාර කරන්න පුළුවන්. අපිට මෙය බරක් විය හැකියි. නමුත් ඒක ඒ විදියට විය යුතුයි.

ඊළඟට අපේ වනමල් මන්ත්‍රීතුමා කිව්වා වගේ, පියල් මන්ත්‍රීතුමාත් මේ ගැන කතා කලා. මාපලගම පිට්ටනියේ කුණු දාලා තියෙනවා කියලා, සිරස රූපවාහිනියේ පෙන්වලා තියෙනවා. මමත් ගියා බලන්න. ඇත්ත කතාව. වැඩකරන සේවකයා තමයි කුණු දාලා තියෙන්නෙ. සිරසෙන් ආපු මහත්වරු මගෙන් ඇහුවා. මොකක්ද කරන්නේ කියලා. මම කිව්වා ඔයාලට ඕන විදිහට දාන්න. කිසි ප්‍රශ්නයක් නැහැ කියලා. මොකද ඒවා දැම්මහම තමයි සත්‍යය එලිවෙන්නෙ. ඊළඟට ක්‍රීඩාපිටිය දැන් සුද්ද කරගෙන යනවා. ගරු මන්ත්‍රීතුමාලට මම එකක් කියන්නම්. පාසල්,පංසල් වලට ගිහිල්ලා පොරොන්දු වෙන්න එපා සුද්ද කරලා දෙන්නම් කියලා. මම හරි අසරණ වෙනවා. මොකද අපට සභාවේ කම්කරුවන් පස්දෙනයි ඉන්නෙ. මන්ත්‍රීතුමා ළඟ ඉඳගෙනම කතාකරනවා, සභාපතිතුමා, අනේ මේ අපේ ඉස්කෝලෙ සුද්ධ කරලා දෙන්න කියලා සභාවේ සේවකයන් ඉල්ලනවා. අන්තිමට ඒ මන්ත්‍රීවරුන්ම කියනවා මේ පාරවල් සුද්ද කරන්නෙ නැහැයි කියලා. ඉන්න සේවකයන් ඉස්කෝලවලට, පන්සල්වලට යැව්වම, පාරවල් සුද්ද කරන්න සේවකයන් නැහැ. අන්තිමට මිනිස්සු කියනවා. මේ අසවලා කම්කරුවන් දෙන්න කිව්වා. නමුත් මේ සභාපතිතුමා දෙන්නෙ නැහැ. වෙන සභාපතිවරුන් ඉදිද්දි, ලේකම්තුමිය ඉදිද්දි මේ කාර්යයන් සිදු වුණා. නමුත් දැන් මේ සභාපතිතුමා කරන්නේ නැහැ කියලා කතා වෙනවා. මන්ත්‍රීවරුත් සාධාරණයි. මොකද මේවා මන්ත්‍රීවරුන්ගෙන් වෙන්න ඕන කාර්යයන්. ඒ නිසා ගරු මන්ත්‍රීතුමන්ලා, මම කියන්නේ මීට පස්සේ එහෙම වැඩ කරන්න එපා කියලා. ඒ වගේම පහුගියදා ගෙදර ඉස්සරහ බල්ලෙක් මැරිලා කියලා 119ට දැනුම් දීලා, නාගොඩ පොලීසියට මේ පැමිණිල්ල දෙනවා. පොලිසියෙ යුතුකම වෙන්නේ අදාළ පළාත් පාලන ආයතනය ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීම. ඒ නිසා සභාවට පැමිණිල්ල දෙනවා. බලන්න අපේ ජන සමාජයට සිදු වු දෙයක්. ගෙදර ඉස්සරහ බල්ලා වළලා ගන්න මිනිස්සුන්ට බැහැ. ඒකටත් සභාවේ සහය බලාපොරොත්තු වෙනවා. මිනිස්සු ඒ තරමටම පහත් තත්වයට වැටිලා. කරුණාකරලා මේ සමාජය දැනුවත් කරන්න. 1990 තියෙන්නෙ වටිනා කියන දෙයක් කරන්න. නමුත් අරක්කු බීලා වැටිලා ඉන්න මනුස්සයත් අරන් යන්න 1990 ට කෝල් එකක් දෙනවා. ඉතින් කොහොමද මේ රට ගොඩ යන්නේ. අන්න ඒක නිසා ඔන්න ඔය වගේ කාරණාත් එක්ක තමයි අපේ ජන සමාජයත් එක්ක අපිට ජීවත් වෙන්න සිදු වෙලා තියෙන්නෙ. ඉතින් අපි කිව්ව වගේ උප්පත්තියේ සිට මරණය දක්වා සියලු කරුණු කාරණා සිදු කරනකොට, හැමකෙනාම හිතනවා මේ කටයුතු කරන්න ඕන සභාවෙන් කියලා.

යම් හොඳ දෙයක් කරද්දි අපි කවුරුවත් හොඳ නැහැයි කියලා කියන්නේ නැහැ. අපි කවදාවත් හොඳ දෙයක් කරද්දි එහෙම කරලා නැහැ. නමුත් එකක් මතක තියාගන්න. යම් යම් දේවල් වල යම් යම් වැරදි එනවා. අපි නොදන්න, අපට පේන්නේ ඒක හොඳයි, හරිම සුන්දරයි. අන්තිමට සහරාන් වගේ බිහිවෙන්න බැරිත් නැහැ. ඔබතුමාලා මතක තියාගන්න. ඊයේ පෙරේදා පාසලක ළමයෙකුගෙ පියෙකුට වෙඩි තිබ්බා. අද වෙන කොට කවුරුවත් ඒ ගැන කතා කරන්නේ නැහැ. කවුරුවත් කතා කළාද? නැහැ. රතුපස්වලදී අර වතුර ප්‍රශ්නයකට වෙඩි තියපු අවස්ථාවෙ එක්කෙනෙක් මැරුණා. ඒ අවස්ථාවෙදි කරපු උද්ඝෝෂණ, විරෝධතා තාමත් අපට මතකයි. මනුස්සයෙක් මැරීම අපි අනුමත කරන්නේ නැහැ. නමුත් එතැනදි ඒ සිදුවීම් ඇහුවම, යම් සාධාරණ කාරණයක් තියෙනවා. ඒ පිළිබඳව මීට වැඩිය කියන්න යන්නේ නැහැ. මොකද උද්ඝෝෂණ, විරෝධතා මැඩපැවැත්වීමට ආරක්ෂක අංශ කළ අවම බලය යෙදවීමක් තුල වූ සිදුවීමක්.

ඊළඟට මාපලගම වැසිකිළිය පිළිබඳව බන්දුල මන්ත්‍රීතුමාගේ කතාව ඉල්ලා අස්කර ගන්න ඕන. අර ලක්ෂ 33ක වියදමින් ඉදිකිරීමට යෝජිතව තිබූ වැසිකිලිය සෑදිමේදී මම බලපෑමට ලක් වුනාලු. මට කිසිම කෙනෙක්ගේ බලපෑමක් ආවේ නැහැ. අදාල ගෙදර අයිති අය තමයි මැරෙන්න හැදුවෙ. සභාවේ අනුමැතිය දීලා තිබුනෙ. අපි නෙවෙයි හදන්නේ. හදන ස්ථානය අපෙන් අනුමැතිය ඉල්ලා තිබුණා.

අපේ අනුමැතිය දීලා තිබුණේ. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සභාවෙන් අවසරය විතරයි ඉල්ලන්නේ. පරිසර බලපත්‍ර ඒවා ඔක්කොම හරි. ඇත්තටම දේශපාලන වශයෙන් තමයි ඒ උදවියට බලපෑම කරලා තියෙන්නේ. මේ නාගොඩවිතාන බලපෑම් කළේ නැහැ. නාගොඩවිතානට දේශපාලන බලපෑම් ආවෙත් නැහැ. බලපෑම් ආවේ කොහෙන්ද කියලා මෙතුමන්ලා දන්නවා. ඒ නිසයි එය නැවතුනේ. දැන් නැවත වැසිකිළි පද්ධතිය හදන්න මුදල් එවනවා කියලා තියෙනවා. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ඒ කටයුතු කරාවි. මොකද වැසිකිළි පහසුකම් නැති නිසා බස්, එක එක තැන නවත්තනවා කියලා අපටත් ලියුමක් එවලා තිබුණා.

ඒ වගේම යථා කාලයේදී වෙළඳ සංකීරණය පූර්ණ අළුත්වැඩියාවකට යොමු කරනවා. අපට පෞද්ගලික ආයතනයක් සම්බන්ධ වෙලා උදව් කිරීමට කැමැත්ත ප්‍රකාශ කළා. ඒකෙදි ඔබතුමා කිව්ව වැසිකිළි පහසුකම්, විදුලිය පහසුකම් වැනි ඒ අවශ්‍ය කටයුතු අපි ඒ අවස්ථාවේදීම කරන්න බලාපොරොත්තු වෙනවා. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාගේ පාරෙ නඩුව පිළිබඳව කතා කරනවා නම්, ඇත්තටම ඒ නඩුව නිසා එතුමා දැන් බොහොම වෙහෙසට පත් වෙලා ඉන්නෙ. අපේ ප්‍රාදේශීය සභා පනතේ තියෙන යම් යම් වගන්ති කිහිපයක් අනුව ඉදිරියේදී අපි කටයුතු කරනවා. ඒ සඳහා අවශ්‍ය උපදෙස් පතලා ලිපියකුත් අපි ඉහල නිලධාරීන්ට යවලා තියෙනවා. ඒ වගේම ඉනෝකා මන්ත්‍රීතුමිය කියපු පාර පිළිබඳව අපි ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරනවා. නන්දන මන්ත්‍රීතුමා කියපු මාළු ලැල්ලට අපි අනුමැතිය දීලා නැහැ. ඒවා ගලවන්න අවශ්‍ය වුන ඕනෑම අවස්ථාවක ඒවා ඉවත් කරන්න කටයුතු කරනවා.

ඒ වගේම ගරු සහබන්දු මන්ත්‍රීතුමා කිව්වා. සහබන්දු වැඩිහිටි නිවාසයට කුණු ගන්න යන්නේ නැහැ කියලා. අපේ පතිනායක මන්ත්‍රීතුමා මේ කර්තව්‍යයට බොහොම උනන්දු වෙනවා. පසුගිය දවස්වල වාහනය ගිහින් තියෙනවා. නමුත් වාහනයට කුණු ලබාදීලා නැහැ. මමත් පෞද්ගලික මට්ටමින් ගිහිල්ලා එතන ඉන්න අයගෙන් ඇහුවම මොනවත් නැහැ කිව්වා. නිලධාරියෙකුගෙන් ඇහුවහම, එයා කිව්වේ අල්ලපු ඉඩමේ වළක් හාරලා, ඒකට කුණු දානවයි කියලා. යථා කාලෙදි එම ස්ථානයේ කසල රැගෙන යාමට කටයුතු සළස්වනවා.

ඒ වගේම තමයි චන්ද්‍ර සහබන්දු මහතා එල්ලුම් ගහ අවශ්‍යයි කියන ස්ථාවරයේ සිටිනවා. මමත් ඒ අදහසේ ඉන්නෙ. මේ දැන් විරුද්ධ වෙන අය ඒ දවස්වල කොහෙද හිටියේ. අගමැතිතුමා එල්ලුම්ගහට විරුද්ධයි. අලුගෝසුවා වැඩ කරන්නේ ඔෆිස් එකේ නෙවෙයි. එහෙනම් අලුගෝසුවා ඉන්නේ එල්ලුම්ගහ ක්‍රියාත්මක කරන්න. එතකොට ඒකට කැමැත්ත දුන්නේ ඒ කට්ටියමයි. ඒ වගේම ලක්ෂ ගාණක් දීලා කඹයක් ගෙනාවේ මොකටද? මම කියන්නේ, දැන් මේ එල්ලුම්ගහට විරුද්ධ වෙන උදවිය අලුගෝසුව පත් කරනකොට, අලුගෝසුවා ඉන්ටර්වීව් කරනකොට, කවුරුත් ඇස් පියාගෙන, කට වහගෙනද හිටියේ. දැන් බොරුවට එල්ලුම්ගහට විරුද්ධයි කියනවා. ඒ මිනිස්සුන්ගෙ හිත් දිනා ගන්න. සහබන්දු මහත්තයා කියපු එකට ඌනපූර්ණයක් මම දුන්නෙ. දැන් මේ අවස්ථාවේ ඒ අය ලකුණු දා ගන්න හදන්නේ.

ඒ වගේම වටවල වතු සමාගමට පිටතින් ගෙන එන ගොම පිළිබඳ ප්‍රශ්නයේදී, අපේ නියෝග මත ලේකම්තුමිය නීත්‍යානුකූලව ලිපියක් සකස් කරලා, අවශ්‍ය තැන් වලට දැනුම් දීම කරාවි. මහජන සෞඛ්‍ය පරීක්ෂක වාර්තා අරගෙන, ගොම ප්‍රවාහනය නතර කරන්න අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරනවා. මම මේ ගැන පොලීසියත් දැනුවත් කරලා, මහජන සෞඛ්‍ය පරීක්ෂකත් දැනුවත් කරලා, ජනතාවට වන අපහසුතාවයන්, පීඩාවන් ඉවත් කිරීමට නීති මගින් කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම වැලි ප්‍රශ්නයේදී වැලි තහනම් කිරීමේ වැඩපිළිවෙලක් මම යෝජනාවක් හැටියට ගේන්න හිටියේ. නමුත් ඒකෙන් අපට යම් යම් ගැටලුකාරී තත්ත්ව මතු වෙන නිසාත්, ඒක ක්‍රමානුකූලව ඉදිරිපත්

කළ යුතු නිසාත් මෙවර ඉදිරිපත් කළේ නැහැ. ඒ වගේම පහුගිය දවස්වල අපි පුහුණුවට සහභාගි වෙලා, ඒ පුහුණුවේදී ලබාපු අත්දැකීම් සමඟ, සභාපති බලතල පිළිබඳවත් අවබෝධ කරගෙන, ඒ වගේම පැය දෙකහමාරක්, තුනක් වැනි කාලසීමාවක් තුළදී අපේ සභාවේ කටයුතු නිම කරන්න කියලා අපට උපදෙස් ලැබුනමුත් ප්‍රායෝගිකව අපට යම් යම් ගැටළු සහගත තත්වයන් ඇතිවෙන නිසා අපි උපරිමයෙන්ම අඩු කාල සීමාවක් තුළ සභාවේ සභා කාලය ඉක්මනින්ම නිම කරන්න අද ඉදලා කටයුතු කරන්න බලාපොරොත්තු වෙමින්, ඉතා වටිනා සභාවාරයක් පවත්වන්නට සහයෝගය දක්වපු උපසභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියන්ලාට ස්තුතිවන්ත වෙමින්, අදට නියමිත සභාවාරය මෙසේ නිම කරනවා. සියලු දෙනාට සුබ අනාගතයක් !

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:- .............................